# 3

# ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

## 3.1 සමස්ත නිරීක්ෂණ

නව වෛරස ප්‍රභේද වර්ධනය වීමත් සමග කොවිඩ්-19 වසංගතය දිගු කාලයක් පුරා ව්‍යාප්ත වීම හමුවේ, ජනතාවගේ සමාජ ආර්ථික යහපැවැත්ම සහතික කරන අතර, ආර්ථික කටයුතු පවත්වා ගෙන යෑමට රටෙහි පවතින ආර්ථික හා සමාජ යටිතල පහසුකම් පද්ධතිය අඛණ්ඩව පහසුකම් සැපයුවේය. ගෝලීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම සහ සැපයුම ඉහළ යෑම සීමාවීම හේතුවෙන් ගෝලීය වෙළඳපොළ බලශක්ති මිල ගණන් ඉහළ යෑම 2021 වසර තුළ පැවති ප්‍රධානතම අභියෝගයක් වූ අතර, නැගෙනහිර යුරෝපා කලාපයේ පවතින භූ දේශපාලනික අර්බුදයත් සමග මෙම මිල ඉහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් වඩාත් අයහපත් වෙමින් පවතී. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) 2021 වසරේ දී දෙවතාවක් මිල සංශෝධන සිදු කළ ද, ගෝලීය මිල ගණන් තවදුරටත් ඉහළ යෑම මෙන්ම, ශ්‍රී ලංකා රුපියල 2022 වසරේ මුල් කාලයේ දී තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් මෙම මිල සංශෝධන ප්‍රමාණවත් නොවීය. ඒ හේතුවෙන් 2022 වසරේ මුල් කාලයේ දී තියුණු ලෙස මිල ගණන් ඉහළ නංවමින් නැවතත් මිල සංශෝධනයක් කිරීමට සිදු විය. පිරිවැය පිළිබිඹු වන පරිදි මිල ගණන් සහ ගාස්තු සඳහා ගැළපීම් නිසි කලට සිදු නොකිරීම හේතුවෙන් බලශක්ති ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතිණි. රජය සතු මෙම වාණිජ ව්‍යවසායයන්වල දිගුකාලීනව පවතින මූල්‍ය ගැටලු සහ විදේශ විනිමය ගලා ඒම් දුර්වල වීම හේතුවෙන් එය රටේ බලශක්ති අර්බුදයක් දක්වා නිර්මාණය වී ඇති අතර, එමගින් පශ්චාත් කොවිඩ්-19 වසංගත අවධිය තුළ ආර්ථිකය යළි නැගී සිටීමට දරන ප්‍රයත්නයට සැලකිය යුතු අන්දමේ අහිතකර බලපෑමක් ඇති කරයි. රටේ සමාජ ආර්ථික යටිතල පහසුකම් පද්ධතිය සඳහා වූ ආයෝජනවල වැදගත්කම හඳුනාගනිමින්, රජය ග්‍රාමීය-නාගරික සබඳතා සහ වාසස්ථානවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ ඛනිජ තෙල් සම්පත් ගවේෂණයට අදාළ නීති බලාත්මක කිරීම, අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ පළමු ව්‍යාපෘතිය කෙරවලපිටියෙහි ආරම්භ කිරීම, සහ 2022 වසරේ ජනවාරි මාසයේදී මධ්‍යම අධිවේගී මාර්ගයේ තවත් කොටසක් විවෘත කිරීමෙන් අනතුරුව නව කැළණි පාලම විවෘත කිරීම ආදිය වසර තුළ දී සිදු කෙරුණු ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් විය. මෙම භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් මධ්‍යයේ, සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා සැපයීමට ද රජය අඛණ්ඩව කැපවූ අතර, කොවිඩ්-19 වසංගතය මගින් ජනතාවට ඇතිවූ කෙටි කාලීන සහ දිගු කාලීන බලපෑම් අවම කිරීමෙහිලා ඉන් විශාල කාර්යය භාරයක් ඉටු වී ඇතැයි අපේක්ෂා කෙරේ. බෝනොවන රෝග සහ ඩෙංගු වැනි වෙනත් බෝවන රෝග මගින් ඇති කළ අභියෝග මධ්‍යයේ, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම පරීක්ෂණ පහසුකම්, ප්‍රතිකාර සහ නිරෝධායන පහසුකම් සැපයීම පමණක් නොව විශේෂයෙන්ම, කොවිඩ්-19 එන්නත සහ වර්ධක මාත්‍රා ලබා දීමේ වැඩසටහන් නිසි කාලයේ දී ක්‍රියාත්මක කිරීම තුළින් කොවිඩ්-19 ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා සෞඛ්‍ය අංශය මූලිකත්වය ගෙන කටයුතු කළේය. රටේ විදුලි සංදේශ අංශයෙන් ලද සහායත් සමග, අධ්‍යාපන ක්ෂේත්‍රය මංගත අධ්‍යාපන ක්‍රමය 'නව සාමාන්‍යකරණ' තත්ත්වයට අනුගත වී ඇති බව දක්නට ලැබෙන අතර, විශේෂයෙන්ම තාක්ෂණික උපාංග හිමිකාරීත්වය අඩු සහ ඒ ආශ්‍රිත සාක්ෂරතාව පහළ මට්ටමක පවතින ග්‍රාමීය සහ වතු අංශයේ පවුල්වල මෙන්ම, දුර්වල අන්තර්ජාල පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල අධ්‍යාපනික ප්‍රතිඵලවල ගුණාත්මකභාවයට අදාළ ගැටලු තවදුරටත් අඛණ්ඩව පවතී. රාජ්‍ය මූල්‍ය

*අවකාශය සීමා වීම මධ්‍යයේ, අඛණ්ඩව දෙවන වසර සඳහාත් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අවදානමට ලක්ව ඇති කුටුම්බ සහ පුද්ගලයින් සඳහා දීමනා ගෙවීමට සහ සහන ක්‍රියාමාර්ග සැලසීමට රජය පියවර ගත්තේය. දිගු කාලයක් මුළුල්ලේ පවතින වසංගතය සහ ඉන් ඇති කෙරෙන බලපෑම් හේතුවෙන් ජනගහනය තුළ දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින සහ කොවිඩ්-19 හේතුවෙන් හෝ වෙනත් හේතුවකින් ආර්ථික ක්‍රියාකාරිත්වයට තවදුරටත් ඇතිවන ඕනෑම බාධාවක් මගින් අවදානමකට පත්වීමේ ඉහළ හැකියාවක් සහිත කණ්ඩායම් තුළින් 'නව දුගී' කාණ්ඩයක් නිර්මාණය වීමේ හැකියාවක් ඇති බව දරිද්‍රතාවට අදාළ දත්ත මගින් පිළිබිඹු කෙරේ. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ රටේ පවතින ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සඳහා වන ආයෝජන ඉතා අභියෝගාත්මක විය හැකි අතර, පසුගිය දශක කිහිපය තුළ පත් වූ රජයන් විසින් සිදුකළ යටිතල පහසුකම් ආයෝජන මගින් කොවිඩ්-19 වසංගතයෙහි දැඩි බලපෑම්වලින් ව්‍යාපාර, පවුල් සහ පුද්ගලයින් බොහෝ දුරට ආරක්ෂා කරගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇති බව පිළිගත යුතුය. කෙසේ වෙතත්, එවැනි ආයෝජනවල කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා කෙටි කාලීන ගැටලු නිරාකරණය කිරීම පමණක් නොව, මැදි කාලීනව තිරසාර පදනමකින් යුතුව ආර්ථිකයේ ඵලදායී විභවතාව ගොඩනැංවීම අරමුණු කරගත් ඉදිරි දැක්මකින් යුතු හා සියලු පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රතිපත්ති සැකසීමට රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඇතුළු අංශ අතර බහු පාර්ශ්වීය සහයෝගය දිරිමත් කිරීම සඳහා රජය විසින් පියවර ගැනීම අවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්ති, කම්පන සහ විචලතාවන් සඳහා ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමෙහිලා අත්‍යවශ්‍ය වන අතර, එමගින් ආර්ථිකයේ තිරසාර ප්‍රගතිය, සැමට ප්‍රතිලාභ හිමිවන ඉහළ වර්ධන මාවතක් කරා යොමුවීම සහතික කෙරෙනු ඇත.*




## 3.2 ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### ඛනිජ තෙල්


**කොවිඩ්-19 වසංගතය නැවත හිස එසවීමත් සමග බොරතෙල් මිල ගණන් ඉහළ යෑම කෙරෙහි ඇති වූ පීඩනය යම්කිසි දුරකට අඩු වුවද, ගෝලීය ආර්ථික වර්ධනය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම මෙන්ම සැපයුම් තත්ත්වයන් සීමා වීම හේතුවෙන්, ගෝලීය බොරතෙල් මිල ගණන් 2021 වසරේ දී ශීඝ්‍රයෙන් ඉහළ ගියේය.** කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමෙන් සිදු වූ ගෝලීය ඉල්ලුම පහළ යෑම හේතුවෙන්, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දී එ.ජ. ඩොලර් 43.35ක් ලෙස පැවතියද, ගෝලීය ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම ආරම්භ වීම මෙන්ම, වසංගතය ආශ්‍රිතව පැවති සංචරණ සීමා ලිහිල් කිරීමත් සමගම ජාත්‍යන්තර වෙළඳපොළ බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2021 වසරේ දී එ.ජ. ඩොලර් 70.80ක් දක්වා සියයට 63.3කින් ඉහළ ගියේය. 2020 වසරේ මැද භාගයේ දී ආරම්භ වූ ගෝලීය බොරතෙල් මිල ගණන් යථා තත්ත්වයට පත් වීම ක්‍රමයෙන් වේගවත් වී, 2021 වසරේ මාර්තු මාසය වන විට වසංගතයට පෙර පැවති මට්ටම් කරා ළඟා වූ අතර, වසර හතක කාලය තුළ වාර්තා කළ ඉහළම මිල මට්ටමක් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී වාර්තා කළේය. වෙස්ට් ටෙක්සාස් ඉන්ටමීඩියට් (ඩබ්.ටී.අයි) බොරතෙල් මිල ගණන් ද ඉහළ යන ප්‍රවණතාවක පැවති අතර, 2020 වසරේ දී එ.ජ. ඩොලර් 39.78ක් ලෙස පැවති බැරලයක මිලට සාපේක්ෂව 2021 වසරේ දී බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 67.94ක් ලෙස වාර්තා විය. ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලිය සම්බන්ධව ඇති සුභවාදී අපේක්ෂා සහ ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (ඔපෙක්) හා එහි මිත්‍ර රටවල් විසින් පවත්වාගෙන යනු ලබන ගෝලීය තෙල් සැපයුම් කොන්දේසි දැඩි වීම මධ්‍යයේ ගෝලීය ඉල්ලුම ඉහළ යෑම, ගෝලීය බොරතෙල් මිල ඉහළ යෑමට මූලික වශයෙන් හේතු විය. කොවිඩ්-19 වසංගතයේ නැවත ව්‍යාප්තිය සමඟ පැන නැගුණු ඉල්ලුම් සම්බන්ධ අවිනිශ්චිතතාවන් සහ වෛරසයේ නව ප්‍රභේද හේතුවෙන් සිදුවන තාවකාලික අගුලු දැමීම් සහ සංචරණ සීමා ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් බොරතෙල් මිල ගණන් පහළ ගිය කෙටි කාල සීමාවන් දක්නට ලැබුණි. රුසියාව සහ යුක්‍රේනය අතර පවතින භූ දේශපාලනික ගැටුම් මධ්‍යයේ, සැපයුම තවදුරටත් සීමා විය හැකි වන බවට වූ අපේක්ෂාවන් හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2008 වසරේ ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2022 වසරේ මාර්තු මාසයේ දී බැරලයක මිල එ.ජ. ඩොලර් 140ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවට අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2020 වසර තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් 45.57ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් 68.86ක් දක්වා සියයට 51.1කින් ඉහළ ගියේය.

**වසර එකහමාරකට වැඩි කාලයකට පසුව 2021 වසරේ දී රජය විසින් ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් ඉහළ දැමීම සඳහා ගෝලීය**

3.1 රූප සටහන
ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල ක්‍රියාකාරිත්වය



**3.2 රූප සටහන**
**ගෝලීය බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතා**



මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

**බොරතෙල් මිල ගණන් අඛණ්ඩව ඉහළ යැම හේතු විය.** ඒ අනුව, ලං.ඛ.නී.සං. 2021 වසරේ ජූනි සහ දෙසැම්බර් මාසවලදී දේශීය මිල ගණන් ඉහළ දමමින් මිල සංශෝධන කළ අතර, පසුව 2022 වසරේ මාර්තු මාසයේ දී සැලකිය යුතු ලෙස මිල ගණන් ඉහළ දැමීය. ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) 2021 වසරේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් අවස්ථා තුනකදී සංශෝධනය කළ අතර, පසුව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී අවස්ථා දෙකකදී ද, 2022 වසරේ මාර්තු මාසයේ දී තවත් අවස්ථා දෙකකදී සැලකිය යුතු ලෙස මිල සංශෝධන කළේය. මෙම ආයතන දෙක විසින්ම 2022 වසරේ මාර්තු මාසයේ දී සිදු කරන ලද මිල සංශෝධන ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මිල සංශෝධනයන් වූ අතර, එම මිල සංශෝධන ගෝලීය බොරතෙල් මිලෙහි ශීඝ්‍ර ඉහළ යැම සහ 2022 වසරේ මාර්තු මාසය ආරම්භයේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම ආවරණය වන ලෙස සිදු කර ඇත. සියලුම පාර්ශ්වකරුවන් අතර, විශේෂයෙන්ම පාරිභෝගිකයන් අතර මිල ගණන් සම්බන්ධයෙන් විනිවිදභාවය වර්ධනය කරන සහ එමගින් මිල ගණන් සංශෝධන පිළිබඳ පොදු ජනතාවගේ පිළිගැනීම ද ඇති කළ හැකි, පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් කඩිනමින් ආයතනගත කිරීමේ අවශ්‍යතාව මෙමගින් නැවත අවධාරණය කරයි. එවැනි මිල සංශෝධන මගින් රටේ පොදු මිල මට්ටමට කෙටි කාලීන බලපෑමක් එල්ල විය හැකි වුවද, මැදි කාලීනව ලං.ඛ.නී.සං.හි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීමටත්, එමගින් සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීමටත්, එවැනි මිල යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ. ගෝලීය සහ දේශීය වෙළඳපොළවල සිදුවන අඛණ්ඩ වර්ධනයන් පිළිබඳව නිසි සැලකිල්ල යොමු කරමින්, ඉදිරි දැක්මකින් යුතු සහ උපායමාර්ගික සැලසුම්කරණයක් නොමැතිවීම, දේශීය වෙළඳපොළට අඛණ්ඩ ඉන්ධන සැපයුමක් ලබාදීමට නොහැකිවීම සඳහා හේතු වී ඇති අතර, එය වර්තමානයේ හටගෙන ඇති අර්බුදය සඳහා කිසියම් දුරකට බලපා ඇති බව නැවත අවධාරණය කළ යුතු වේ. මිලකරණයට මෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව පාරදෘශ්‍යභාවයක් පැවතීම, ලං.ඛ.නී.සං.හි තිරසාර භාවයට සහ ශක්‍යතාවය සඳහා අත්‍යවශ්‍ය වේ.

**වසර තුළ දී, විදුලිබල අංශය සඳහා වූ විකුණුම් පහළ යැම හේතුවෙන්, දේශීය වෙළෙඳපොළ තුළ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය තවදුරටත් සියයට 7.7කින් පහත වැටුණි.** කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වූ අප්‍රේල් සහ අගෝස්තු යන මාසවල දී ඇතැම් ආර්ථික කටයුතු කරගෙන යැමට ඉඩ ලබා දීම හේතුවෙන්, 2021 වසර තුළ ආර්ථික ක්‍රියාකාරකම්වල පිබිදීමක් සිදු විය. ඒ අනුව, ලං.ඛ.නී.සං. මගින් ප්‍රවාහන, කාර්මික සහ ගුවන් සේවා යන අංශ වෙත අලෙවි කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 10.4කින්, සියයට 39.5කින් සහ සියයට 18.6කින් වර්ධනය විය. මේ අතර, ජලාශවල පැවති හිතකර ජල මට්ටම් සමඟ ජලවිදුලි උත්පාදනය කෙරෙහි වැඩි වශයෙන් යොමු වීම හේතුවෙන්, විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ඩීසල් සහ දැවි තෙල් අලෙවිය, පිළිවෙළින්, සියයට 23.2කින් සහ සියයට 35.9කින් කැපී පෙනෙන ලෙස පහළ ගිය අතර, එමගින් ලං.ඛ.නී.සං.හි සමස්ත විකුණුම් කාර්ය සාධනය පහළ ගියේය.

**2021 වසර තුළ දී සපුගස්කන්ද පිරිපහදුව විවිධ අවස්ථාවල දී වසා දැමීම හේතුවෙන් පිරිපහදු නිෂ්පාදනය සමස්තයක් වශයෙන් සියයට 24.7ක පහළ යැමක් වාර්තා කළේය.** 2021 වසරේ පෙබරවාරි මස මැද භාගයේ සිට මාස දෙකකට ආසන්න කාලයක් සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා පිරිපහදුව වසා දැමීමෙන් අනතුරුව, පිරිපහදු කටයුතු සඳහා බොරතෙල් නොමැතිවීම හේතුවෙන් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී පිරිපහදුව සති තුනක කාලයක් සඳහා නැවත වසා දැමිණි. එමනිසා, සමස්ත බොරතෙල් යෙදවුම් ප්‍රමාණය සියයට 24.5කින් පහළ ගිය අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ඩීසල්, පෙට්‍රල්, දැවි තෙල් සහ නැප්තා වැනි ප්‍රධාන නිෂ්පාදිතවල පිරිපහදු නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 31.1කින්, සියයට 24.5කින්, සියයට 22.9කින් සහ සියයට 31.9කින් පහළ ගියේය. ලං.ඛ.නී.සං. විසින් පිරිපහදු කළ නිෂ්පාදිත ආනයනය කිරීම හරහා මෙම නිෂ්පාදන


හිඟයන් පූරණය කරන ලද අතර, එම ආනයන වසර තුළ දී සියයට 15.2කින් ඉහළ ගොස් ඇත.

**දේශීය බනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවුවද, ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්ය සාධනය 2021 වසරේ දී තවදුරටත් දුර්වල විය.** ගෝලීය බොරතෙල් මිල ගණන්වල තියුණු ඉහළ යෑමට අනුකූලව මිල සංශෝධන ප්‍රමාද වීම හා ප්‍රමාණවත් නොවීම පිළිබිඹු කරමින්, විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලං.ඛ.නී.සං. පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 33.9ක මෙහෙයුම් ලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 41.7ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. 2021 වසරේ දී ප්‍රවාහනය සහ විදුලිබල උත්පාදනය යන ප්‍රධාන අංශ වෙත අලෙවි කරන ලද බනිජ තෙල් නිෂ්පාදිතවලින් මෙහෙයුම් අලාභ සිදු වූ අතර, ගුවන් සේවා සහ කර්මාන්ත අංශවලට අලෙවි කරන ලද බනිජ තෙල් නිෂ්පාදිතවලින් මෙහෙයුම් ලාභ ඉපැයිණි. කෙසේ වෙතත්, 2021 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ලං.ඛ.නී.සං.ට රුපියල් බිලියන 33.2ක සැලකිය යුතු විනිමය අනුපාත විචල්‍යතා අලාභයක් ඇති වූ අතර, එමගින් ලං.ඛ.නී.සං.හි සමස්ත ලාභයට (බදුවලට පෙර) සෘණාත්මක බලපෑමක් ඇති කරමින්, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 2.4ක ලාභයට සාපේක්ෂව 2021 වසර තුළ දී රුපියල් බිලියන 82.2ක අලාභයක් වාර්තා විය. මේ අතර, ලං.ඛ.නී.සං. විසින් බැංකු අංශයෙන් ලබා ගත් ණය ප්‍රමාණය 2021 වසරේ දී රුපියල් බිලියන 505.3ක් දක්වා රුපියල් බිලියන 123.5කින් ඉහළ ගිය අතර, දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකුවල පැවති ලං.ඛ.නී.සං.ට අයත් තැන්පතු ප්‍රමාණය 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 140.1ක් දක්වා රුපියල් බිලියන 76.2කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) සහ ශ්‍රීලංකන් ගුවන් සේවයෙන් අයවිය යුතු ණය ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු සමස්ත හිඟ ණය මුදල, 2020 වසරේ පැවති රුපියල් බිලියන 142.7ක සිට 2021 වසර තුළ දී රුපියල් බිලියන 161.1ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර අවසානයේ දී, ලං.වි.ම. හා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අය විය යුතු හිඟ මුදල, ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින් සියයට 90.1ක් පමණ විය. විදේශ විනිමය ගලා ඒම් හිඟවීමත් සමඟ ලං.ඛ.නී.සං.හි දුර්වල මූල්‍ය තත්ත්වයත් හේතුවෙන් නිසි කලට සහ පිරිවැය ඵලදායී ලෙස ඉන්ධන ප්‍රසම්පාදනය කර ගැනීම කෙරෙහි බාධා ඇති විය. නිසි කලට ඉන්ධන ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සහ ලං.ඛ.නී.සං. ණය සඳහා රාජ්‍ය බැංකු ද්විත්වය මත පමණක් පදනම් වීම අවම කිරීමේ අරමුණින්, 2022 වසරේ ජනවාරි මාසයේ දී, ඉන්ධන මිලදී ගැනීමට අත්‍යවශ්‍ය ආනයන බිල්පත් සඳහා මූල්‍ය සම්පාදනය බලපත්‍රලාභී බැංකු අතර, ඔවුන්ගේ විදේශ විනිමය ප්‍රවාහයට සමානුපාතිකව බෙදා හැරීමට ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් විය. 2022 වසරේ මුල් භාගයේ දී, විශේෂයෙන්ම, ඉන්දියාවෙන් පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම සඳහා ඉන්දියානු අපනයන-ආනයන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් මිලියන 500ක කෙටි කාලීන ණයක් ලබා ගැනීමට රජය විසින් පියවර ගන්නා ලදී.

**මූල්‍යමය වශයෙන් පිරිමැසුම්දායක ආකාරයෙන් බනිජ තෙල් නිෂ්පාදිත අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා ලං.ඛ.නී.සං. විසින් ඒකාග්‍ර ප්‍රයත්නයක්**


3

**3.3 රූප සටහන**
**දේශීය බනිජ තෙල් මිල සංශෝධන**
**ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව**





මූලයː ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

**3.4 රූප සටහන**
**දේශීය බනිජ තෙල් මිල සංශෝධන**
**ලංකා අයිඕසී පොදු සීමිත සමාගම**




මූලයː ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

**3.5 රූප සටහන**
**ප්‍රවාහන අංශය සඳහා පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය**




මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

**දැරීමේ කඩිනම් අවශ්‍යතාවක් පවතී.** ශ්‍රී ලංකාව තුළ මිල සංශෝධනවලට සාපේක්ෂව, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ඉල්ලුම් නම්‍යතාව, විශේෂයෙන්ම, ප්‍රවාහන අංශය තුළ, සාපේක්ෂ වශයෙන් අඩුය. 2015 සිට 2019 දක්වා කාලය තුළ ලං.ඛ.නී.සං. මගින් ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණයෙහි සාමාන්‍යය වූ ලීටර බිලියන 3.4ට සාපේක්ෂව 2021 වසරේ දී එම අගය ලීටර බිලියන 3.6ක් ලෙස වාර්තා වීම තුළින් මෙම තත්ත්වය මනාව පෙන්නුම් කෙරේ. 2022 වසරේ මුල් භාගයේ දී ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම මිල සංශෝධන සිදු කිරීම් මධ්‍යයේ පවා ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා අඛණ්ඩව දැඩි ඉල්ලුමක් පැවතීම තුළින් මෙය තවදුරටත් සනාථ වේ. ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වන ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, පුනර්ජනනීය විදුලි උත්පාදන ධාරිතාව පුළුල් කිරීම, පෞද්ගලික ප්‍රවාහනය භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ගාස්තු අය කිරීම හෝ රථවාහන තදබදය සඳහා ගාස්තු අය කිරීම වැනි ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධව පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වැනි ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම සීමා කළ හැකි වෙනත් ක්‍රම හඳුනා ගැනීමට, බලශක්ති අමාත්‍යාංශය විසින් ලං.ඛ.නී.සං. සහ විදුලිබල හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් යුතුව විශේෂ පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. දේශීය හා ගෝලීය වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් ලං.ඛ.නී.සං. විසින් ඉදිරි දැක්මක් සහිතව තීරණ ගැනීමේ ක්‍රියාවලියක නිරත වීමේ දැඩි අවශ්‍යතාවක් ඇති බව දැනට පවතින බලශක්ති අර්බුදය මගින් නැවත වතාවක් අවධාරණය කරයි. මෑත මාසවල දී දක්නට ලද සැපයුම් අවහිරතා කිසියම් දුරකට විදේශ මුදල් ද්‍රවශීලතා ගැටලු

**3.1 සංඛ්‍යා සටහන**
**ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2020(අ) | 2021(ආ) |
| ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000) | | | | |
| බොරතෙල් | 1,667 | 1,182 | -9.5 | -29.1 |
| පිරිපහදු නිෂ්පාදිත | 4,028 | 4,553 | -15.0 | 13.0 |
| ගල් අඟුරු | 2,600 | 2,206 | 8.8 | -15.1 |
| එල්.පී. ගෑස් | 437 | 422 | 1.7 | -3.3 |
| දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000) | 25 | 17 | -6.4 | -34.1 |
| ආනයන වටිනාකම (මි.ර.ගැ.) | | | | |
| බොරතෙල් (රු.මිලියන) | 107,665 | 123,865 | -38.0 | 15.0 |
| (එ.ජ.ඩො. මිලියන) | 583 | 625 | -39.9 | 7.2 |
| පිරිපහදු නිෂ්පාදිත (රු. මිලියන) | 321,818 | 564,681 | -33.4 | 75.5 |
| (එ.ජ.ඩො. මිලියන) | 1,742 | 2,840 | -35.6 | 63.0 |
| ගල් අඟුරු (රු.මිලියන) | 40,194 | 55,118 | 3.8 | 37.1 |
| (එ.ජ.ඩො. මිලියන) | 217 | 278 | 1.3 | 27.8 |
| එල්. පී. ගෑස් (රු.මිලියන) | 43,812 | 64,436 | 1.5 | 47.1 |
| (එ.ජ.ඩො. මිලියන) | 236 | 324 | -2.2 | 37.2 |
| බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.) | | | | |
| (රු./බැරල්) | 8,415 | 13,645 | -31.6 | 62.2 |
| (එ.ජ.ඩො./බැරල්) | 45.57 | 68.86 | -33.8 | 51.1 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය (මෙ.ටො. '000) | 798 | 853 | -18.9 | 7.0 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම (රු.මිලියන) | 68,849 | 100,975 | -26.1 | 46.7 |
| (එ.ජ.ඩො. මිලියන) | 374 | 506 | -28.3 | 35.6 |
| දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000) | 4,600 | 4,246 | -16.8 | -7.7 |
| ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ) | 1,139 | 1,238 | -10.2 | 8.7 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 120 | 116 | -23.6 | -3.5 |
| සුදු ඩීසල් (ඈ) | 1,750 | 1,875 | -18.2 | 7.1 |
| සුපිරි ඩීසල් | 69 | 75 | -18.8 | 8.2 |
| භූමිතෙල් | 176 | 188 | -14.8 | 7.2 |
| දැවිතෙල් | 971 | 513 | -4.0 | -47.2 |
| ගුවන්යානා ඉන්ධන | 189 | 224 | -60.2 | 18.6 |
| නැප්තා | 165 | 11 | 1.7 | -93.5 |
| දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000) | 473 | 457 | 1.5 | -3.3 |
| දේශීය මිල (වසර අවසානයේ දී) (රු./ලීටර) | | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | 137.00 | 177.00 | - | 29.2 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 161.00 | 207.00 | - | 28.6 |
| සුදු ඩීසල් | 104.00 | 121.00 | - | 16.3 |
| සුපිරි ඩීසල් | 132.00 | 159.00 | - | 20.5 |
| භූමිතෙල් | 70.00 | 87.00 | - | 24.3 |
| දැවිතෙල් | | | | |
| තත්පර 800 | 70.00 | 110.00 | -27.1 | 57.14 |
| තත්පර 1,500 | 70.00 | 110.00 | -27.1 | 57.14 |
| එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්) | | | | |
| ලිට්‍රෝ ගෑස් | 119.44 | 214.00 | - | 79.2 |
| ලාෆ්ස් ගෑස් | 119.44 | 227.20 | - | 90.2 |
| ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්) | | | | |
| බ්‍රෙන්ට් | 43.35 | 70.80 | -32.3 | 63.3 |
| ඩබ්.ටී.අයි. | 39.78 | 67.94 | -30.2 | 70.8 |
| ඛනිජ තෙල් සහ අනෙකුත් ද්‍රව ඉන්ධන | | | | |
| ලෝක සැපයුම (දිනකට බැරල් මිලියන) | 93.9 | 95.6 | -6.4 | 1.8 |
| ලෝක ඉල්ලුම (දිනකට බැරල් මිලියන) | 92.0 | 97.5 | -8.6 | 6.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරීන් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
එ.ජ. බලශක්ති තොරතුරු පරිපාලනය

හේතුවෙන් ද පැන නැගුණ ද, ලං.වි.ම. සහ අනෙකුත් අදාළ රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමග ඒකාග්‍රව, ලං.ඛ.නී.සං. විසින් කාලෝචිත සහ විචක්ෂණශීලී තීරණ ගැනීම හරහා ද මෙම සැපයුම් අවහිරතා බොහෝ දුරට අවම කර ගත හැකිව තිබුණි.

**ඛනිජ තෙල් අංශයේ කාර්ය සාධනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී, මන්දගාමීව වුවද ක්‍රියාත්මක විය.** රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් ලෙස, *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම* (Built-Operate-Transfer) යන ආකෘතිය යටතේ, දිනකට බැරල් 100,000ක ධාරිතාවක් සපයන නව පිරිපහදුවක් සපුගස්කන්දෙහි පිහිටුවීම සඳහා වන සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය, ලං.ඛ.නී.සං. විසින් 2021 වසරේ දී අවසන් කරන ලදී. මේ අතර, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා පවතින ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කොළොන්නාව තෙල් ගබඩා පරිශ්‍රයේ මුළු ධාරිතාව ඝන මීටර් 93,000කින් යුතු ගබඩා ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ලං.ඛ.නී.සං. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස ගුවන් යානා ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ද ආරම්භ කළේය. මීට අමතරව, ලං.ඛ.නී.සං. යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු (Liquefied Natural Gas) බලාගාර ව්‍යාපෘතිය යටතේ කැලණිතිස්ස බලාගාරයට ගෑස් සම්ප්‍රේෂණය කරන නල මාර්ගය ඉදිකිරීම සඳහා ලං.වි.ම. සමඟ අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කළේය. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සහ ව්‍යාපෘති යෝජනා ඇගයීම 2021 වසරේ දී ආරම්භ කළ අතර, ගෑස් නල මාර්ග ව්‍යාපෘතිය 2023 වසර වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. 2022 වසරේ මුල් භාගයේ දී ඉන්දියානු තෙල් සංස්ථාව (Indian Oil Corporation) සමඟ එක්ව දියත් කිරීමට නියමිත ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව, ත්‍රිකුණාමලය තෙල් ගබඩා සංකීර්ණයේ ඇති තෙල් ටැංකි 99න් තෙල් ටැංකි 24ක් ලං.ඛ.නී.සං.ට ලබා දීමට සහ තවත් 61ක් ලං.ඛ.නී.සං. සහ අයි.ඕ.සී. සමාගමේ හවුල් ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කිරීමට නියමිත අනුබද්ධිත ආයතනයක් මගින් වැඩිදියුණු කිරීමට නියමිත අතර, ඉතිරි ටැංකි 14 අයි.ඕ.සී. සමාගම විසින් සංවර්ධනය කිරීමට නියමිතය.

**2021 වසර තුළ දී උද්ගාමී ඛනිජ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා ජාතික සැලැස්මක් සංවර්ධනය කිරීමේ කටයුත්තෙහි රජය අඛණ්ඩව නියැලී සිටියේය.** ස්වාධීන, කාර්යක්ෂම සහ පාරදෘශ්‍යභාවයකින් යුතු උද්ගාමී තෙල් ගවේෂණයට අදාළ නෛතික රාමුවක් ස්ථාපිත කිරීමේ මූලික අරමුණ ඇතිව, 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත 2021 ඔක්තෝබර් මාසයේ දී බලාත්මක කරනු ලැබූ අතර, එමගින් පැහැදිලි ජාතික උද්ගාමී ප්‍රතිපත්තියක් සහ ඛනිජ තෙල් සම්පත් හා ඒ ආශ්‍රිත මෙහෙයුම් කටයුතු අධීක්ෂණය මෙන්ම කළමනාකරණය කිරීම සඳහා නියාමන හා මෙහෙයුම් රාමුවක් නිර්මාණය කළේය. නව ඛනිජ තෙල් සම්පත් පනත බලාත්මක කිරීමෙන් පසුව, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙනුවට ස්වාධීන නියාමකයෙකු ලෙස *ශ්‍රී ලංකා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අධිකාරිය* 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ස්ථාපිත කරන ලදී. තවද, ජාත්‍යන්තර තෙල් නිධි සීමා නිර්ණය කිරීම් සහ වර්තමාන ප්‍රවණතාවලට අනුකූලව, කුඩා ගවේෂණ බිම් 871ක් සහ මන්නාරම, කාවේරි සහ ලංකා ද්‍රෝණිය ආවරණය වන පරිදි විශාල ගවේෂණ බිම් තුනකින් සමන්විත නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් සිතියමක් සකස් කර 2021 වසරේ ජූලි මාසයේ දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 2020 වසරේ දී ගැසට් කරන ලද *ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට* අනුකූලව, *වායු උපයෝගීකරණ ප්‍රධාන සැලැස්ම* කෙටුම්පත් කිරීමට අදාළ මූලික කටයුතු 2021 වසරේ දී සිදු වෙමින් පැවති අතර, එම සැලැස්ම ශ්‍රී ලංකා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අධිකාරිය විසින් 2022 මුල් භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කෙරේ.


### විදුලිබලය

**2021 වසරේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ විදුලිබලය සඳහා වූ ඉල්ලුම අඛණ්ඩව ඉහළ ගියේය.** 2021 වසර තුළ දී, ජල විදුලිබල උත්පාදනයේ දායකත්වය ඉහළ යැමත් සමඟ, පෙර වසරට සාපේක්ෂව විදුලිබල උත්පාදනය ගිගා වොට් පැය (ගි.වො.පැ.) 16,716ක් දක්වා සියයට 6.4කින් වර්ධනය විය. ජල පෝෂක ප්‍රදේශවලට ලැබුණු අධික වර්ෂාපතනය හේතුවෙන් වසර පුරා ජලාශවල ජල මට්ටම සියයට 60කට වඩා ඉහළ මට්ටමක පැවති අතර, එමගින් විදුලිබලය සඳහා වූ ඉල්ලුම සපුරාලීම සඳහා අඩු පිරිවැයක් සහිත ජලවිදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පැවතීමට හැකි විය. ඒ අනුව, ජලය උපයෝගී කරගත් සමස්ත විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 5,640ක් දක්වා සියයට 44.2කින් ඉහළ ගිය අතර, සමස්ත විදුලි උත්පාදනය සඳහා ජල විදුලිබල දායකත්වය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 25.0 සිට 2021 වසරේ දී සියයට 34.0ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලිබල

උත්පාදනය මත වන රැඳියාව අඩු කරමින් 2020 වසරට සාපේක්ෂව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, ද්‍රව ඉන්ධන භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 2,634ක් දක්වා සියයට 37.0කින් පහළ ගිය අතර, ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 5,519ක් දක්වා සියයට 4.1කින් පහළ ගියේය. මේ අතර, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය, පසුගිය වසරේ වාර්තා කළ ගි.වො.පැ. 2,922ට සාපේක්ෂව සියයට 56.6ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, මේ සඳහා ජාතික විදුලිබල පද්ධතියට නව පුනර්ජනනීය බලශක්ති බලාගාර, විශේෂයෙන්ම මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු මන්නාරම් සුළං විදුලි බලාගාරය එකතු කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සමස්ත විදුලිබල උත්පාදන සංයුතිය සඳහා ද්‍රව ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදන දායකත්වය, පිළිවෙළින්, සියයට 16ක්, සියයට 33ක් සහ සියයට 17ක් විය. තවද, 2021 වසරේ දී සමස්ත විදුලිබල උත්පාදනයට ලං.වි.ම.හි දායකත්වය සියයට 76.0ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිලදී ගන්නා ලදී. දුරස්ථ සහ ග්‍රාමීය ප්‍රදේශ වෙත විදුලිබල සැපයුම පුළුල් වුවද, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේ දී සිදු වන සමස්ත විදුලිබල හානිය 2021 වසරේ දී මුළු විදුලිබල උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.0ක් විය. වියළි කාලගුණ තත්ත්වය ආරම්භ වීම මධ්‍යයේ ජලාශවල ජල මට්ටම ශීඝ්‍රයෙන් අඩු වීම හේතුවෙන් 2022 වසරේ මුල් භාගයේ සිට ජල විදුලිබල උත්පාදනය ශීඝ්‍රයෙන් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තාප විදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන්

**3.6 රූප සටහන**

**විදුලිබල උත්පාදන සංයුතිය**




මූලය: ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

**3.2 සංඛ්‍යා සටහන**

**විදුලිබල අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | වර්ධන අනුපාතය % 2020(අ) | වර්ධන අනුපාතය % 2021(ආ) |
|---|---|---|---|---|
| ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | 4,265 | 4,187 | 1.2 | -1.8 |
| ජල විදුලිබලය (ඇ) | 1,383 | 1,383 | -1.1 | - |
| ද්‍රව ඉන්ධන (ඈ) | 1,268 | 1,087 | -1.1 | -14.3 |
| ගල් අඟුරු | 900 | 900 | - | - |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 715 | 817 | 12.4 | 14.3 |
| ජනනය කළ ඒකක (ගිගාවොට් පැය) | 15,714 | 16,716 | -1.3 | 6.4 |
| ජල විදුලිබලය (ඇ) | 3,911 | 5,640 | 3.4 | 44.2 |
| ද්‍රව ඉන්ධන (ඈ) | 4,182 | 2,634 | -16.6 | -37.0 |
| ගල් අඟුරු | 5,754 | 5,519 | 7.3 | -4.1 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 1,866 | 2,922 | 5.9 | 56.6 |
| මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය) | 14,286 | 15,214 | -2.2 | 6.5 |
| ගෘහස්ථ සහ ආගමික | 5,172 | 5,320 | 6.3 | 2.9 |
| කර්මාන්ත | 4,164 | 4,822 | -5.2 | 15.8 |
| පොදු සේවා සහ හෝටල් (ඊ) | 3,238 | 3,342 | -9.1 | 3.2 |
| වීදි ආලෝක කිරීම | 108 | 97 | -0.8 | -9.8 |
| ලං.වි. සමාගම (LECO) | 1,605 | 1,633 | -4.7 | 1.7 |
| ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය) | 1,624 | 1,603 | -1.3 | -1.3 |
| ගෘහස්ථ සහ ආගමික | 739 | 717 | 6.8 | -3.0 |
| කර්මාන්ත | 279 | 306 | -4.7 | 9.6 |
| පොදු සේවා සහ හෝටල් (ඊ) | 583 | 557 | -8.9 | -4.5 |
| වීදි ආලෝක කිරීම | 23 | 23 | 7.7 | 3.4 |
| ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (%) | 9.1 | 9.0 | 10.3 | -1.1 |
| පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (උ) | 7,213 | 7,401 | 2.0 | 2.6 |
| ඉන්, ගෘහස්ථ සහ ආගමික | 6,273 | 6,411 | 1.8 | 2.2 |
| කාර්මික | 70 | 73 | 3.8 | 4.2 |
| පොදු සේවා හා හෝටල් (ඊ) | 867 | 915 | 4.3 | 5.5 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ

(ඈ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය

(ඉ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව

(ඊ) රාජ්‍ය අංශය සඳහා සිදුකළ අලෙවිය ද ඇතුළත්ය

(උ) සී.ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම


යැපීමට සිදුවීම හේතුවෙන්, 2022 වසරේ මුල් මාස තුළ දී ආර්ථිකයට අවශ්‍ය බලශක්ති ඉල්ලුම සපුරාලීමේ දුෂ්කරතාවලට ලං.වි.ම. මුහුණ දෙමින් සිටී. ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ රට තුළ පවතින විදේශ විනිමය ගැටලු සමඟ ඉන්ධන මිලදී ගැනීමේ දී මතු වූ දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට ක්‍රියාත්මකවන පරිදි විදුලිබල සැපයුම සීමා කිරීමට සිදු වී තිබේ.

ප්‍රධාන වශයෙන් 2020 වසරේ දී ඉල්ලුම පහළ යෑම නිසා ඇති වූ පදනම් බලපෑම හේතුවෙන් 2021 වසරේ දී විදුලිබල අලෙවිය ගි.වො.පැ. 15,214ක් දක්වා

**සියයට 6.5කින් ඉහළ ගියේය.** ආගමික ස්ථාන සහ වීදි ආලෝකකරණ හැර, අනෙකුත් සියලුම විදුලි පරිභෝජන කාණ්ඩවල ඉල්ලුම, සමස්ත විදුලි අලෙවියෙහි වර්ධනය ඒ සඳහා හේතු විය. වසර තුළ දී සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 1.4ක් වන හෝටල් අංශය වෙත සිදුකළ විදුලිබල අලෙවිය, 2020 වසරේ දක්නට ලැබුණු සියයට 29.2ක ශීඝ්‍ර පහළ යෑමට සාපේක්ෂව, සියයට 13.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, විදුලි බිල්පත් සැකසීම මනු කියවන්නන් හරහා සිදු කිරීමේ දී ගැටලුවලට මුහුණ දීමට ලං.වි.ම.ට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විදුලිබල අලෙවිය සහ විදුලිබල උත්පාදනය පිළිබඳ දත්ත අතර සැලකිය යුතු නොගැළපීම් නිර්මාණය වී ඇත. ඒ අනුව, දුරස්ථ විසන්ධි කිරීම සහ ස්වයංක්‍රීයව යළි සබඳතාව ලබාදීමේ පහසුකම හරහා නිවැරදි සහ තත්කාලීනව බලශක්ති දත්ත රැස් කිරීමට ලං.වි.ම. පියවර ගෙන ඇත. දෙහිවල සහ කටුනායක ප්‍රදේශවල වාණිජ මට්ටමේ සුහුරු මනු කියවීමේ ව්‍යාපෘති දෙකක් ආරම්භ කර ඇත. මෙම සුහුරු මනු කියවීමේ තාක්ෂණය කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් බිල්පත් සැකසීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු කිරීමට සහ ඊට අදාළ ගාස්තු ඉක්මනින් හා කාර්යක්ෂමව අයකර ගැනීම සහතික කරනු ඇති අතර, එය ලං.වි.ම.යේ මූල්‍ය ප්‍රවාහ වර්ධනය කිරීමට හේතු විය හැකි බැවින්, එවැනි කාලානුරූපී පියවර ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ.

**2021 වසරේ දී ලං.වි.ම.යේ මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු වීම සඳහා ජල විදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන් පදනම් වීම මෙන්ම, අධික පිරිවැයක් සහිත ද්‍රව ඉන්ධන භාවිතා කෙරෙන විදුලිබල උත්පාදනය අඩු වීම ද උපකාරී විය.** කෙසේ වෙතත්, මෙම වසර තුළ සිදු වූ අලාභ මෙන්ම, පසුගිය කාලය තුළ සිදු වූ අලාභ පියවා ගැනීම සඳහා මෙම මූල්‍ය ප්‍රගතිය ප්‍රමාණවත් නොවුණි. විගණනය නොකළ තාවකාලික මූල්‍ය දත්තවලට අනුව, ලං.වි.ම. 2020 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 69.2ක අලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 22.0ක අලාභයක් වාර්තා කළේය. ලං.වි.ම. විසින් බැංකු අංශයෙන් ලබාගත් කෙටිකාලීන ණය සහ ලං.ඛ.නි.සං. හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත වූ නොපියවූ වගකීම් 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 208.4ක සිට 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 237.8ක් දක්වා ඉහළ ගිය අතර, ලං.වි.ම.හි දිගුකාලීන නොපියවූ වගකීම්, 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 483.8ක

**3.7 රූප සටහන**
**විදුලි බලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව**




(අ) උත්පාදන අන්තයේ සාමාන්‍ය පිරිවැය

මූලය: ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

සිට 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 502.8ක් දක්වා ඉහළ ගියේය. විදුලි බිල්පත් පියවීම සඳහා සහන කාලයක් ලබා දීමට සහ බිල්පත් ගාස්තු නොගෙවූ පාරිභෝගිකයින්ගේ සේවා විසන්ධි කිරීම කල් දැමීමට රජය ගත් තීරණය, ලං.වි.ම.යේ මුදල් ප්‍රවාහය තවදුරටත් දුර්වල කළේය. මීට අමතරව, 2022 වසරේ මුල් භාගයේ දී දේශීය ඉන්ධන මිල ගණන් සඳහා සිදු කළ සංශෝධන මෙන්ම, 2022 වසරේ ඉතිරි කාලයේ දී ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවිය හැකි ඉහළ යෑම්, 2022 වසරේ දී ලං.වි.ම.යේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි තවදුරටත් අහිතකර බලපෑම් එල්ල කරනු ඇත. විදුලිය ගාස්තු සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සහ විශේෂයෙන්ම 2014 වසරේ සිටම විදුලිය ගාස්තුවල සංශෝධනයක් සිදු නොවීම සැලකිල්ලට ගෙන විධිමත් කාල පරාසයක් තුළ ගාස්තු සංශෝධනය කිරීමේ ඇති අවශ්‍යතාව මෙම වර්ධනයන් තුළින් නැවත නැවතත් අවධාරණය කෙරේ. එමෙන්ම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කෙරෙන බලශක්ති උත්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග ගැනීම ද අවශ්‍ය වේ.

**විදුලිබල අංශයේ නියාමන අධිකාරිය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අඛණ්ඩ විදුලිබල සැපයුමක් සහතික කිරීම සඳහා සිය අධීක්ෂණ සහ නියාමන ක්‍රියාකාරකම් නොකඩවා ශක්තිමත් කළේය.** ලං.වි.ම. විසින් *2022-2041 සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම* 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එම සැලැස්මට අනුව 2030 වසර වනවිට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට

3

50ක් පමණ පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් සිදුවනු ඇත. කෙසේ වෙතත්, 2030 වසර වනවිට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 70ක් සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව යොදා ගැනීම පිළිබඳ වූ රජයේ අරමුණට අනුකූලව විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම යළි සකස් කරන ලෙසට සහ සංශෝධිත විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම 2022 වසරේ ජූනි මාසය වන විට ඉදිරිපත් කරන ලෙසට ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම.යෙන් ඉල්ලීම් කර ඇත. පරිසරයට අහිතකර හානි සිදු නොවන පිරිසිදු බලශක්තියක් සැපයීම සඳහා රජයේ කැපවීම නැවත අවධාරණය කිරීමට සහ තිරසාර බලශක්ති සංවර්ධනයක් සහතික කිරීම සඳහා නුදුරු අනාගතයේ දී නව ගල් අඟුරු බලාගාර ඉදි නොකිරීමට 2021 වසරේ ජූලි මාසයේ දී, කැබිනට් මණ්ඩලය විසින් තීරණය කළේය. 2050 වසර වන විට කාබන් විමෝචනය අඩු කිරීම සඳහා වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා *එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ සම්මුතිය* යටතේ පවතින නිර්ණායකවලට අනුකූල වීම මෙහි අරමුණ වේ. මේ අතර, ජාතික විදුලි කාර්මික වෘත්තීය බලපත්‍ර ක්‍රමයක් සැකසීම, පුනර්ජනනීය බලශක්ති බලාගාර අධීක්ෂණය කිරීම සහ විදුලි කාර්මිකයන් සහ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධ වෙනත් අධීක්ෂණ සහ නියාමන කටයුතු ද මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය.

**3.3 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු**

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | වර්ධන අනුපාතය (%) | |
|---|---|---|---|---|
| | | | 2020(අ) | 2021(ආ) |
| ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | 10.35 | 8.78 | -19.8 | -15.2 |
| ජල විදුලිය | 2.33 | 1.67 | -6.6 | -28.3 |
| ද්‍රව ඉන්ධන | 29.01 | 32.03 | -9.3 | 10.4 |
| ගල් අඟුරු | 10.87 | 10.68 | -13.1 | -1.7 |
| පෞද්ගලික අංශයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | 22.94 | 16.94 | -13.3 | -26.2 |
| ද්‍රව ඉන්ධන | 27.55 | 30.35 | -8.7 | 10.2 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව (ඇ) | 18.99 | 16.22 | 4.2 | -14.6 |
| සමස්ත සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | | | | |
| උත්පාදන අවස්ථාවේ දී | 13.99 | 11.74 | -15.8 | -16.1 |
| විකුණුම් අවස්ථාවේ දී | 21.67 | 18.63 | -10.2 | -14.0 |
| සාමාන්‍ය ගාස්තුව (රු./කි.වො.පැ.) | 16.72 | 16.37 | 0.5 | -2.1 |
| ගෘහස්ථ | 14.87 | 14.91 | 5.2 | 0.3 |
| පොදු සේවා | 23.91 | 23.42 | -0.1 | -2.0 |
| රාජ්‍ය අංශය | 18.06 | 18.25 | -0.7 | 1.1 |
| කර්මාන්ත | 14.84 | 14.70 | 0.8 | -0.9 |
| හෝටල් | 18.13 | 17.79 | 2.4 | -1.9 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව තුළ ජල විදුලිය සඳහා වූ සාමාන්‍ය පිරිවැය ඇතුළත් වේ.

මූලයː ලංකා විදුලිබල මණ්ඩලය

**විදුලිබල ඉල්ලුමෙහි අඛණ්ඩ වර්ධනයට සමගාමීව බලශක්ති උත්පාදනය පුළුල් කිරීමේ අරමුණින් විදුලි බලාගාර කිහිපයක සංවර්ධන කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක විය.** විදුලිබලය උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්මට අනුව, ද්‍රවීකෘත ස්වභාවික වායුව විදුලිබල උත්පාදනයේ ප්‍රධාන ප්‍රභවය බවට පත් කිරීමේ අපේක්ෂාව සලකා බලමින්, ශ්‍රී ලංකාවේ ප්‍රථම ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය කෙරවලපිටියේ ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. ඒ අනුව, 2021 වසරේ මාර්තු මාසයේ දී ඉදිකිරීම් ආරම්භ වූ, මෙ.වො. 300ක විදුලි ජනන ධාරිතාවක් සහිත ප්‍රථම ද්‍රවීකෘත ස්වභාවික වායු පදනම් කරගත් විදුලි බලාගාරය 2024 වසරේ මුල් භාගය වන විට ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂිත අතර, දැනට ඉදිකිරීම් කටයුතු මූලික අදියරේ පවතින, මෙ.වො. 300ක විදුලි ජනන ධාරිතාවක් සහිත දෙවන විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ද 2024 වසර අවසානයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. *ඉදිකිරීම, හිමිකාරීත්වය සහ ක්‍රියාත්මක කිරීම* (Built-Own-Operate) යන පදනම මත, ද්‍රවීකෘත ස්වභාවික වායු පරිවර්තන පහසුකම් සහිතව දිය මත ඉදිවන ගබඩා සංකීර්ණයක් සහ *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම* (Built-Operate-transfer) යන පදනම යටතේ බෙදා හැරීමේ නල මාර්ගයකින් සමන්විත ද්‍රවීකෘත ස්වභාවික වායු පර්යන්තයක් ඉදිකිරීම සඳහා තරඟකාරී ලංසු කැඳවීම ද ලං.වි.ම. විසින් ආරම්භ කරන ලදී. ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුමට යම් බාධා සිදුවිය හැකි අවස්ථාවක දී අඛණ්ඩ සැපයුමක් තහවුරු කිරීම සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාර තුළ ඉන්ධන සැපයුම් සහ ගබඩා පහසුකම් ඇතුළත් ද්විත්ව ඉන්ධන ශක්‍යතාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. තවද, පද්ධතියෙහි විශ්වසනීයත්වය පවත්වා ගනු ලබන අතර, පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් එක් කිරීම සහ පද්ධතිය තුළ සිදුවන හානිය අඩු කිරීමේ අරමුණින්, විදුලිබල සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පද්ධතිය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ හානි අවම කිරීමේ ව්‍යාපෘතිය සහ විදුලිබල සැපයුම් පද්ධතිවල ස්ථාවරබව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ඇතුළු සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ව්‍යාපෘති කිහිපයක් ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කෙරෙන විදුලිබල උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවීම හරහා බලශක්ති ක්ෂේත්‍රයේ තිරසාර බව සහතික කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රයත්න දැරුවේය.** ඒ අනුව, 2021 වසර අවසානය වන විට ප්‍රධාන ජල විදුලිබල ව්‍යාපෘති වන උමා ඔය (මෙ.වො. 120) සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් (මෙ.වො. 35ක) ව්‍යාපෘති අවසන් වීමට ආසන්න අදියරේ පැවති අතර, 2022 වසර තුළ දී එම ව්‍යාපෘති ද්විත්වයෙහිම විදුලි උත්පාදන කටයුතු ආරම්භ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, මොරගොල්ල, ගිංගඟ සහ තල්පිටිගල ජල විදුලිබල ව්‍යාපෘති ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවති අතර, මෙමගින් ජාතික විදුලිබල පද්ධතියට මෙ.වො. 65ක ධාරිතාවක් එක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ මැද භාගයේ දී මෙ.වො. 100ක ධාරිතාවකින් යුතු මෙරට ප්‍රථම මහා පරිමාණ සුළං විදුලි බලාගාරය, මන්නාරම (අදියර I), එහි පූර්ණ ධාරිතාවයෙන් යුතුව සාර්ථක ලෙස ආරම්භ කෙරුණු අතර, මෙම බලාගාරය මගින් තවත් මෙ.වො. 50ක විදුලි බලයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට සැලසුම් කර ඇත. මන්නාරම් ප්‍රදේශයේ මෙ.වො. 100ක විදුලි ජනන ධාරිතාවක් සහිත සුළං විදුලිබල උද්‍යාන දෙකක් අදියර දෙකක් යටතේ ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇති අතර, පූනරීන් පුනර්ජනනීය ද්වි ප්‍රභව බලශක්ති උද්‍යානයේ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ස්ථාපිත සුළං විදුලි බලාගාරවල සංවර්ධන කටයුතු ද සිදුවෙමින් පවතී. සූර්ය බලශක්තියට අදාළව, 2021 වසර අවසානයේ දී පාරිභෝගිකයින් 27,068ක් පමණ *සූර්ය බල සංග්‍රාමය* ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇති අතර, මෙම ව්‍යාපෘතිය යටතේ මෙ.වො. 416ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. මේ අතර, සියඹලාණ්ඩුව සූර්ය බල උද්‍යානයේ (මෙ.වො. 100ක) සහ පූනරීන් පුනර්ජනනීය ද්විප්‍රභව බලශක්ති උද්‍යානයේ (මෙ.වො. 150ක) මූලික කටයුතු මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය. රජයේ ගොඩනැගිලි සහ ආගමික ස්ථානවල වහල මත සූර්යබල පැනල ස්ථාපනය කිරීම මෙන්ම, ජලාශ මත පාවෙන සූර්යබල පැනල සවිකිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා 2021 වසරේ ජුනි මාසයේ දී ඉන්දියාව සමඟ එ.ජ.ඩො. මිලියන 100ක ණය ගිවිසුමක් අත්සන් කළේය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය මගින් මෙ.වො.120ක අතිරේක සූර්යබල උත්පාදන ධාරිතාවක් විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කෙරේ. ත්‍රිකුණාමලය සාම්පූර් ප්‍රදේශයේ සූර්ය විදුලි බලාගාරයක් ස්ථාපිත කිරීම සඳහා 2022 වසරේ මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව ඉන්දියාවේ ජාතික තාප බලාගාර සංස්ථාව සමඟ ගිවිසුමකට අත්සන් තැබිණි. බලශක්ති උත්පාදනයේ නව පියවරක් ලෙස, මෙ.වො.10ක ධාරිතාවයකින් යුත් කෙරවලපිටියේ ඉදි කළ ශ්‍රී ලංකාවේ පළමු ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයේ මෙහෙයුම් කටයුතු 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ආරම්භ විය. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙමින් පැවතිය ද, සමස්ත විදුලිබල උත්පාදන සංයුතියෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් සපුරාලීමේ රජයේ ප්‍රතිපත්ති අරමුණ සාක්ෂාත් කරගැනීම සහතික කරමින්, විදුලිබල ඇණහිටීම් සහ අධික පිරිවැයක් සහිත විකල්ප විදුලිබල උත්පාදන ක්‍රම හරහා විදුලිබලය ජනනය කිරීම වළක්වාලීම සඳහා මෙම යෝජිත සහ සැලසුම් කර ඇති ව්‍යාපෘති නියමිත වේලාව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. තවද, දිගුකාලීන ආර්ථික පිරිවැය මෙන්ම, ඉහළ ප්‍රාග්ධන ආයෝජන අවශ්‍යතාව හා නඩත්තු පිරිවැය සහ බලශක්ති ප්‍රභව හේතුවෙන් පරිසරය හා සමාජය මත ඇතිවිය හැකි බාහිරතා සැලකිල්ලට ගනිමින් සුදුසු සහ තිරසාර බලශක්ති සංයුතියක් සැකසීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සහ යෝජිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන ප්‍රමාදවීම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කැබිනට් අනුකමිටුවක් ද පත් කර ඇත.

3

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙරට තිරසාර බලශක්ති සංවර්ධනය දිරිගැන්වීම සඳහා වන සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය.** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙරට බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා පහසුකම් සැලසීමට බලශක්ති කළමනාකරණ පද්ධතිය පිහිටුවීම සහ මිලදී ගන්නා උපකරණවල බලශක්ති පරිභෝජනය පිළිබඳ පාරිභෝගිකයා දැනුම්වත්කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි බලශක්ති සංරක්ෂණ කටයුතුවල නිරත විය. පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම, ව්‍යාපෘති සඳහා සුදුසු භූමි ප්‍රදේශ සහ සරිලන සම්ප්‍රේෂණ පද්ධති හඳුනා ගැනීම පිළිබඳ නිසි අවධානය යොමු කරමින්, *2021-2026 කාලපරිච්ඡේදය සඳහා වන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම* ද සම්පාදනය කර ඇත. මීට අමතරව, දේශීය පුනර්ජනනීය ප්‍රභව වාණිජ මට්ටමේ ව්‍යාපෘති බවට සංවර්ධනය කිරීම කඩිනම් කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙත බලශක්ති බලපත්‍ර සහ තාවකාලික අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කළේය.

### මාර්ග සංවර්ධනය

**ග්‍රාමීය-නාගරික සබඳතා වැඩිදියුණු කිරීම මූලික කොටගත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි ක්‍රියාමාර්ග, ගමනාගමන කාලය අඩු කිරීම සඳහා මහාමාර්ග ප්‍රවාහනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ පුද්ගල හා භාණ්ඩ යන දෙඅංශයෙහිම ප්‍රවාහන කටයුතුවල පහසුව වර්ධනය කිරීමේ අරමුණින් යුතුව අඛණ්ඩව ක්‍රියාත්මක විය.** වසර තුළ දී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන ලැබූ ජාතික මහාමාර්ගවල (A සහ B කාණ්ඩයේ මාර්ග) සමස්ත දිග කිලෝමීටර් 12,225ක් වූ අතර, අධිවේගී මාර්ගවල සමස්ත දිග කිලෝමීටර් 312.6ක් විය. වසර තුළ දී අධිවේගී හා මහා මාර්ග නඩත්තුව හා සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වභාවික ආපදාවලින් බලපෑමට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය හරහා මහාමාර්ග ජාලය වැඩිදියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් බිලියන 200.8ක පමණ වියදමක් දරා ඇත. 2021 වසර තුළ දී, අධිවේගී මාර්ග සහ මහාමාර්ග සංවර්ධනය සඳහා දරන ලද වියදම, පිළිවෙළින්, රුපියල් බිලියන 19.0ක් සහ රුපියල් බිලියන 155.9ක් වූ අතර, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමට අදාළ වියදම රුපියල් බිලියන 14.7කි.

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රම සම්පත් සැපයුම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් අභියෝග ඇති වුවද, නාගරික-ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ එමගින් සැමට ප්‍රතිලාභ අත්වන වර්ධනයකට සහාය වීම සඳහා රටේ අධිවේගී මාර්ග ජාලය ශක්තිමත් කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය.** ඒ අනුව, කඩවත සිට දඹුල්ල දක්වා විහිදෙන මධ්‍යම අධිවේගී මාර්ගයට අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා වසර තුළ දී ප්‍රමුඛතාව ලබා දුන් අතර, 2022 වසරේ ජනවාරි මැද භාගයේ දී එහි මීරිගම සිට කුරුණෑගල දක්වා මාර්ග කොටස මහජනතාව සඳහා විවෘත කරන ලදී. තවද, පොතුහැර සිට රඹුක්කන දක්වා අධිවේගී මාර්ගයේ පළමු කිලෝමීටර් 12ට අදාළ මූලික ඉදිකිරීම් කටයුතු ද වසර තුළ දී ආරම්භ විය. කඩවත සිට මීරිගම දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පැවති අතර, එම ව්‍යාපෘතියේ IVවන කොටසට අදාළ කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටසේ ඉඩම් අත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමට අදාළව ප්‍රගතිය 2021 වසර අවසන් වන විට සියයට 70.7ක් විය. මේ අතර, කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා වන කිලෝමීටර් 76ක් දිග රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව, කහතුඩුව සිට ඉංගිරිය දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ I වන අදියරේ ඉදිකිරීම් කටයුතු 2021 වසරේ දී ආරම්භ විය. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අදාළ ශක්‍යතා අධ්‍යයනය නැවත ඇගයීම අවසන් කිරීමෙන් අනතුරුව ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා දිවෙන අදියර II සහ III ආරම්භ විය.

**2021 වසරේ දී අධිවේගී මාර්ග තුළ ධාවනය කළ සමස්ත රථ වාහන සංඛ්‍යාව ඉහළ ගියේය.** ඒ අනුව, 2021 වසර තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට ගොඩගම දක්වා සහ පාලටුව සිට මත්තල දක්වා දෛනිකව ධාවනය කළ රථ වාහන සංඛ්‍යාව, පිළිවෙළින්, සියයට 2.7කින් සහ සියයට 30.4කින් ඉහළ ගියේය. මේ අතර, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 6.7ක සහ සියයට 38.8ක වර්ධනයක් වාර්තා කළේය. මෙවැනි ධනාත්මක ප්‍රවණතා හේතුවෙන්, 2021 වසරේ දී වාර්ෂික ආදායමෙහි සියයට 20.6ක වර්ධනයක් වාර්තා කරමින් අධිවේගී මාර්ගවලින් ලැබුණු ආදායම, දළ වශයෙන් රුපියල් බිලියන 8.8ක් දක්වා ඉහළ ගියේය. 2022 වසරේ ජනවාරි මාසය මැද භාගයේ දී මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා දිවෙන කොටස විවෘත කිරීමෙන් අනතුරුව, 2022 වසරේ පෙබරවාරි මාසය අවසන් වන විට, මෙම කොටස සඳහා අදාළ ගාස්තු අයකිරීම්වල එකතුව රුපියල් මිලියන 134.4ක් විය.

**දැනට පවතින මාර්ග පද්ධතිය සහ පාලම් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීම්වලට අදාළ ක්‍රියාකාරකම් වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** 2021 වසරේ නොවැම්බර් මාසය අග භාගයේ දී, පැලියගොඩ නව කැලණි පාලම විවෘත කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවලට අදාළ ප්‍රධාන පියවරක් වේ. මෙම ව්‍යාපෘතිය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ කොළඹ වරාය සම්බන්ධ කෙරෙන ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් මධ්‍යයේ පිහිටා ඇත. අලුතින් ඉදි කරන ලද මංතීරු හයකින් සමන්විත පාලම සහ එහි සිට නගරය කරා දිවෙන කුළුණු මත ඉදි වූ මාර්ගය හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ කොළඹ ප්‍රදේශයේ දක්නට ලැබුණු වාහන තදබදයට විසඳුමක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොම්පඤ්ඤවීදිය හා ගැටඹේ හන්දිය සහ කොහුවල හන්දිය ආශ්‍රිත ගුවන් පාලම් ඉදිකිරීම වැනි තවත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ආරම්භ කරන ලදී. මීට අමතරව, කොච්චිකඩේ අතුරු මාර්ගය සහ අලව්ව

හා මුත්තෙට්ටුගල දුම්රිය හරස් මාර්ගවල ගුවන් පාලම් ඉදිකිරීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන අවසන් කර ඇති අතර, සමුද්‍ර මාර්ගය දෙහිවල සිට පානදුර දක්වා දීර්ඝ කිරීමේ කටයුතු මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය. බදුල්ල-චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට (A005) සමගාමීව, විශේෂයෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය ඇතුළු දක්ෂිණ මාර්ගවල සබඳතා සංවර්ධනය කෙරෙහි ඉලක්කගත කෙරුණු දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක විය. මේ අතර, වසර තුළ දී නව කැලණි පාලමේ සිට පිටත වටරවුම් අධිවේගී මාර්ගය දක්වා කුළුණු මතින් දිවෙන අධිවේගී මාර්ගය ඉදිකිරීමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරමින් පැවති අතර, නව කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා දිවෙන කොටසේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම අවසන් විය.

### මාර්ගස්ථ මගී ප්‍රවාහනය

**කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වරින් වර සංචරණ සීමා පැනවීම සහ පෞද්ගලික ප්‍රවාහන සේවා සඳහා වන කැමැත්ත ඉහළ යෑම මධ්‍යයේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සීමා වූ ප්‍රවාහන මෙහෙයුම් කටයුතු පෙන්නුම් කරමින්, මාර්ගස්ථ මගී ප්‍රවාහන කටයුතුවල සමස්ත කාර්ය සාධනය 2021 වසරේ දී අඛණ්ඩව පහළ ගියේය.** එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) සහ පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන මෙහෙයුම් කටයුතු 2021 වසරේ දී කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, පිළිවෙළින්, සියයට 19.7කින් සහ සියයට 28.4කින් පහළ ගිය අතර, ධාවනය කළ සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 2020 වසරේ දී වාර්තා වූ 4,045ට සාපේක්ෂව 2021 වසරේ දී 4,449ක් දක්වා ඉහළ ගියේය. එම බස් රථ සංඛ්‍යාව වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා ඵලදායි ලෙස යොදා ගත හැකි බස් රථ සංඛ්‍යාවෙන් සියයට 85.7ක් පමණ විය. මේ අතර, පෞද්ගලික අංශය මගින් ධාවනය කළ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය පෙර වසරේ වාර්තා කළ බස් රථ 10,787ක සිට 2021 වසරේ දී බස් රථ 9,053ක් දක්වා සියයට 16.1කින් පහළ ගියේය. වසර තුළ දී, පෞද්ගලික අංශයේ බස් රථවල මගී කිලෝමීටර් ගණන සහ ධාවන කිලෝමීටර ගණන ද, පිළිවෙළින්, සියයට 12.2කින් සහ සියයට 4.4කින් පහළ ගියේය. 2021 වසර අවසානය වන විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් අතර බස් රථ ධාවනය සඳහා බලපත්‍ර 1,978ක් ද, පළාත තුළ බස් රථ ධාවනය සඳහා බලපත්‍ර 16,914ක් ද පෞද්ගලික අංශයට ලබා දී තිබුණි.

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට විශේෂයෙන් ම, ආසන ධාරිතාව සීමා කිරීමට අදාළ මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, 2021 වසර තුළ දී ආරක්ෂිත පොදු ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය.** ඒ අනුව, කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව *සිසු සැරිය, ගැමි සැරිය* සහ *නිසි සැරිය* ඇතුළු විශේෂ බස් රථ සේවා කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. පාසල් ළමුන් ප්‍රවාහනය පහසු කිරීම සඳහා නව බස් රථ සේවා 97ක් පමණ *සිසු සැරිය* සේවාවට එකතු කරන ලදී. 2021 වසර අවසානය වන විට, *සිසු සැරිය* වැඩසටහන යටතේ බස් රථ සේවා 1,563ක් ද, *නිසි සැරිය* වැඩසටහන යටතේ බස් රථ සේවා 194ක් ද සහ *ගැමි සැරිය* ග්‍රාමීය බස් රථ සේවා වැඩසටහන යටතේ සේවා 14ක් ද ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින්, අලුතින් නිසි සැරිය සේවා 305ක් එක් කිරීම සඳහා වසර තුළ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව ශ්‍රී ලං.ග.ම.ට අනුමැතිය ලබා දුන්නේය. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ද දකුණ, සබරගමුව, ඌව සහ උතුරු මැද යන පළාත් ආවරණය වන පරිදි නව බස් රථ සේවා 59ක් ද ආරම්භ කළේය.

**2021 වසර තුළ දී අවස්ථා දෙකක දී දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීමත් සහ 2022 වසරේ මාර්තු මාසයේ දී නැවත සිදු වූ මිල සංශෝධනය කිරීමත් සමඟ ජාතික ගමනාගමන කොමිෂන් සභාවට බස් ගාස්තු ඉහළ දැමීම සඳහා කටයුතු සිදු කිරීමට සිදු විය.** ඒ අනුව, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී සාමාන්‍ය, සුඛෝපබෝගී සහ අර්ධ සුඛෝපබෝගී බස් ගාස්තු සාමාන්‍යයෙන් සියයට 17.4කින් ඉහළ නැංවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අවම බස් ගාස්තුව රුපියල් 14.00ක සිට රුපියල් 17.00 ක් දක්වා ඉහළ ගියේය. සංශෝධිත බස් ගාස්තු 2022 වසරේ ජනවාරි 05 වන දින සිට ක්‍රියාත්මක විය. බස් ගාස්තුවල සාමාන්‍යය සියයට 15.0කින් ඉහළ නංවමින් 2022 වසරේ මාර්තු මාසයේ දී තවත් ගාස්තු සංශෝධනයක් සිදු වූ අතර, ඒ අනුව අවම බස් ගාස්තුව රුපියල් 20.00ක් දක්වා ඉහළ ගියේය.

**සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලං.ග.ම.යේ මෙහෙයුම් අඩුවීමත් සමඟ 2021 වසරේ දී එහි මූල්‍ය කාර්ය සාධනය අඛණ්ඩව පසුබෑමට ලක් විය.**

**3.4 සංඛ්‍යා සටහන**

**රථවාහන නව ලියාපදිංචි කිරීම**

| ශීර්ෂය | 2020 | 2021 (අ) | වර්ධන අනුපාතය % 2020 | වර්ධන අනුපාතය % 2021 (අ) |
|---|---|---|---|---|
| **රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව)** | **202,628** | **33,850** | **-44.8** | **-83.3** |
| බස් රථ | 578 | 281 | -64.2 | -51.4 |
| මෝටර් රථ | 21,021 | 3,495 | -45.0 | -83.4 |
| ත්‍රිරෝද රථ | 7,150 | 2,093 | -53.8 | -70.7 |
| ද්විත්ව කාර්ය වාහන | 9,532 | 771 | -29.2 | -91.9 |
| යතුරු පැදි | 151,634 | 8,011 | -46.7 | -94.7 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 3,941 | 4,432 | -24.5 | 12.5 |
| ඉඩම් වාහන | 8,302 | 14,764 | 8.3 | 77.8 |
| කොඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස | 470 | 3 | -64.4 | -99.4 |

(අ) තාවකාලික

මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3

විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.ග.ම.හි සමස්ත ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 26.9ක් දක්වා සියයට 13.7කින් පහළ ගිය අතර, සමස්ත වියදම ද රුපියල් බිලියන 30.4ක් දක්වා සියයට 9.1කින් පමණ අඩු විය. ශ්‍රී ලං.ග.ම. පසුගිය වසරේ වාර්තා කළ රුපියල් බිලියන 2.2ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 3.4ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. වසර තුළ දී, ආර්ථික වශයෙන් ප්‍රතිලාභ නොලැබෙන මාර්ගවල ප්‍රවාහන සේවා යෙදවීමට සහ සහනාධාර වාර ප්‍රවේශපත්‍ර සඳහා පහසුකම් සැලසීමට රජය විසින් ලබාදුන් සහනාධාර මුදල රුපියල් බිලියන 12.2කි. මේ අතර, ශ්‍රී ලං.ග.ම. සිය බස් රථ සංඛ්‍යාව ඉහළ නැංවීමටත්, එමගින් මගීන්ට සපයන සේවා වැඩිදියුණු කිරීමටත් වැඩසටහන් කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. ඒ අනුව, ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු බස් රථ 213ක් පමණ සමස්ත බස් රථ සංඛ්‍යාවට එක් කළ අතර, 2022 වසරේ මුල් භාගයේ දී ශ්‍රී ලං.ග.ම. සඳහා ඉන්දීය ණය පහසුකම යටතේ නව බස් රථ 500ක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

**කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම අත්‍යවශ්‍ය නොවන ආනයන මත පනවා ඇති සීමාවල බලපෑම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී නව මෝටර් රථ ලියාපදිංචිය අඛණ්ඩව පහළ ගියේය.** 2020 වසර තුළ දී සිදු වූ සියයට 44.8ක පහළ යෑම හා සැසඳීමේ දී නව මෝටර් රථ ලියාපදිංචිය 2021 වසරේ දී සියයට 83.3කින් කැපී පෙනෙන ලෙස පහළ ගියේය. තනි කැබ් රථ, මෝටර් කාර් රථ, යතුරුපැදි සහ ද්විත්ව කාර්ය රථවල නව ලියාපදිංචිය සියයට 80කට වඩා පහළ යෑමක් වාර්තා කිරීමත් සමඟ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී සියලුම ප්‍රධාන මෝටර් රථ කාණ්ඩවල අඩු වීමක් දක්නට ලැබුණි.

## දුම්රිය ප්‍රවාහනය[1]


**ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) 2021 වසරේ දී අඛණ්ඩව දුර්වල මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළේය.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.දු.සේ. 2020 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10.1ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී, මෙම වසර තුළ දී රුපියල් බිලියන 10.3ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. මගී ප්‍රවාහනයෙන් ඉපැයූ ආදායම සියයට 53.0කින් පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ආදායම, පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 2.7ක් දක්වා සියයට 41.3කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. ආදායමෙහි මෙම පහළ යෑම සඳහා අප්‍රේල් සහ අගෝස්තු යන මාසවල දී කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්, පිළිවෙළින්, රුපියල් බිලියන 13.0ක් සහ රුපියල් බිලියන 27.4ක් දක්වා, පිළිවෙළින්, සියයට 11.2කින් සහ සියයට 19.6කින් පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත වියදම රුපියල් බිලියන 40.4ක් දක්වා සියයට 17.1කින් පහළ ගියේය. මෙහෙයුම් අඩු වීම හේතුවෙන් සේවක වැටුප් වියදම් මෙන්ම, ඉන්ධන වියදම් පහළ යෑම පුනරාවර්තන වියදමෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**මන්දගාමී වේගයකින් වුව ද, 2021 වසරේ දී ශ්‍රී ලං.දු.සේ. යටිතල පහසුකම් සංවර්ධන සහ සේවා වැඩිදියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන ගියේය.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ

1 මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරන විට, ශ්‍රී ලංකා දුම්රිය සංස්ථාවේ 2021 වසරේ මෙහෙයුම්වලට අදාළව දත්ත නිකුත් වී නොතිබිණි.

**3.8 රූප සටහන**

**රථවාහන නව ලියාපදිංචිය**




මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**3.5 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ රජය සතු ව්‍යවසායවල මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | වර්ධන අනුපාතය % 2020 (අ) | වර්ධන අනුපාතය % 2021 (ආ) |
|---|---|---|---|---|
| 2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 309 | 248 | -28.4 | -19.7 |
| මගී කිලෝමීටර් (මිලියන) | 8,623 | 6,175 | -39.9 | -28.4 |
| මුළු ආදායම (රු. මිලියන) | 31,233 | 26,948 | -28.2 | -13.7 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 33,437 | 30,386 | -20.3 | -9.1 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | -2,204 | -3,438 | -241.6 | 56.0 |
| 3. ශ්‍රී ලංකා දුම්රිය සේවය | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 7,990 | ලැ.නො. | -28.9 | - |
| මගී කිලෝමීටර් (මිලියන) | 3,906 | ලැ.නො. | -46.6 | - |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 114 | ලැ.නො. | -1.1 | - |
| මුළු ආදායම (රු. මිලියන) | 4,567 | 2,679 | -42.2 | -41.3 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 14,618 | 12,979 | -5.5 | -11.2 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | -10,051 | -10,300 | 32.9 | 2.5 |
| 4. ශ්‍රීලංකන් ගුවන් සේවය | | | | |
| පියාසර කරන ලද පැය ගණන | 41,585 | 50,287 | -61.1 | 20.9 |
| මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන) | 3,641 | 2,868 | -76.5 | -21.2 |
| මගී ආසන පිරීමේ අනුපාතය (%) | 56 | 36 | -32.6 | -36.0 |
| බර පැටවීමේ අනුපාතය (%) | 62 | 74 | -16.8 | 19.6 |
| භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000) | 56 | 93 | -54.3 | 66.0 |
| සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 6,489 | 5,732 | -3.3 | -11.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලයන්: ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

අවහිරතා මධ්‍යයේ මධ්‍යස්ථ වේගයකින් වුව ද, දුම්රිය මාර්ග පද්ධති, දුම්රිය ඒකක සහ දුම්රිය සංඥා හා විදුලි සංදේශ සේවාවලට අදාළ සියලුම වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සිදු විය. වසර තුළ දී කුරණ සිට මීගමුව දක්වා දිවෙන දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර, මහනුවර සිට සරසවි උයන දක්වා කිලෝමීටර 5ක දිගකින් යුතු දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදී. 2020 වසරේ දී ආරම්භ කරන ලද මගී දුම්රිය මැදිරි 200ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද අතර, මෙම ව්‍යාපෘතියේ පුළුල් කිරීමක් ලෙස තවත් මගී දුම්රිය මැදිරි 100ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ යටතේ 2021 වසරේ දී මගී දුම්රිය මැදිරි 30ක් නැවත ධාවනයට මුදා හැර ඇත. 2017 වසරේ දී ලබාගත් ඉන්දියානු ණය පහසුකම යටතේ වායුසමීකරණය කළ බලවේග කට්ටල දෙකක් මිලදීගෙන දුම්රිය පද්ධතියට එක් කරන ලද අතර, වසර තුළ දී මගී දුම්රිය මැදිරි 120ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි. ප්‍රධාන මාර්ගයේ, වෙරළබඩ මාර්ගයේ, පුත්තලම මාර්ගයේ, කැලණිවැලි මාර්ගයේ, මාතලේ මාර්ගයේ, උතුරු මාර්ගයේ සහ නැගෙනහිර මාර්ගයේ පිහිටා ඇති දුම්රිය පාලම්වල නඩත්තු කටයුතු වසර තුළ දී සිදුවෙමින් පැවතුණි. වසර තුළ දී සංඥා සහ විදුලි සංදේශ පද්ධති සැපයීමට අදාළ ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

## සිවිල් ගුවන් සේවය

**කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ විදේශ ගමන් සඳහා වන රුචිය අඩු වීම හේතුවෙන් සිවිල් ගුවන් සේවා කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** ඒ අනුව, 2020 වසරේ දී දක්නට ලැබුණු සියයට 76.0ක ශීඝ්‍ර පහත වැටීමෙන් අනතුරුව, 2021 වසරේ දී මගී පැමිණීම් සංඛ්‍යාව සියයට 36.8කින් අඛණ්ඩව පහළ ගියේය. පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව සුළු පහළ යෑමක් පමණක් වාර්තා කළේය. මගීන්ගේ ගමනාගමනය පහසු කිරීම සහතික කරන අතරම, කොවිඩ්-19 ආශ්‍රිත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන්ගේ කැපවීම මෙම අංශයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා හේතු විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට අමතරව, රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ද ජාත්‍යන්තර සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශවලට අනුගත වීම වෙනුවෙන් ජාත්‍යන්තර ගුවන් තොටුපළ කවුන්සිලය (Airports Council International) වෙතින් ගුවන් තොටුපළ සෞඛ්‍ය ප්‍රතීතන සහතිකය ලබාගෙන ඇත. මේ අතර, මැදපෙරදිග ඇතැම් ගමනාන්ත වෙත ගමන් කරන මගීන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින්, වේගවත් පී.සී.ආර්. පරීක්ෂණ සේවා පහසුකමක් ද

**3.9 රූප සටහන**
**ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්**




මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ස්ථාපිත කර තිබුණි. 2022 වසරේ මාර්තු මාසයේ සිට, පූර්ණ එන්නත්කරණයට ලක් වූ සහ වයස අවුරුදු 12ට අඩු මගීන්ට තවදුරටත් පී.සී.ආර්. පරීක්ෂණ හෝ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ අවශ්‍ය නොවිණි. වසංගතය ක්‍රමිකව පහව යෑමත් සමග විදේශ ගමන් සාමාන්‍යකරණය කිරීමට ගත් එවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් සිවිල් ගුවන් සේවා අංශය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ඇතැම් බාධා මධ්‍යයේ වුවද, ගුවන් යානා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මන්දගාමීව ක්‍රියාත්මක විය.** ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ දෙවන පර්යන්තය (A පැකේජය) ඉදිකිරීමෙහි කටයුතු අඛණ්ඩව කරගෙන ගියේය. 2021 වසරේ නොවැම්බර් මාසයේ දී, ගුවන් සමාගම්වල භාවිතය සඳහා ගුවන් යානා නවත්වන කොටස සහ ගුවන් යානා බැහැරුම් පථය (B පැකේජය) විවෘත කරන ලදී. තවද, 2021 වසර අවසානය වන විට, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන සංවර්ධන ප්‍රධාන සැලැස්ම - 2030 වසර උදෙසා වන දැක්ම යටතේ අතිරේක ගුවන් යානා නවත්වන කොටසක් සහිත නව ගුවන් යානා බැහැරුම් පථයක් ඉදිකිරීමට අදාළ කටයුතුවලින් සියයට 75ක් නිම කර ඇත.

**2021 වසරේ මුල් භාගයේ දී ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකා දේශ සීමා නැවත විවෘත කිරීම සහ සමස්තයක් ලෙස ගෝලීය වශයෙන් සංචාරක කටයුතු සඳහා ඇති කැමැත්ත වර්ධනය වීම මධ්‍යයේ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි දුර්වල මූල්‍ය කාර්ය සාධනයෙහි කිසියම් වැඩිදියුණු වීමක් වාර්තා විය.** 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 49.3ක වර්ධනයක් වාර්තා කරමින්, 2021 වසරේ දෙසැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 14.3ක් දක්වා පහළ ගියේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ ලැබූ මෙම වර්ධනය සඳහා, ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් වියදමෙහි වාර්තා වූ සියයට 54.9ක ඉහළ යෑම අභිබවමින් මෙහෙයුම් ආදායම සියයට 152.9කින් වැඩි වීම හේතු විය. ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් කටයුතුවල සැලකිය යුතු දියුණුවක් ඇති කිරීමට දායක වූ කැපී පෙනෙන පියවර අතර, භාණ්ඩ මෙහෙයුම් කටයුතු යටතේ අපනයන මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යෑම පමණක් නොව අත්‍යවශ්‍ය ඖෂධ සැපයුම් සහ එන්නත් ප්‍රවාහනය කිරීම සඳහා ද ඉහළ අවධානයක් යොමු වීම ඇතුළත් විය. ශ්‍රීලංකන් ගුවන් සේවය සිය දේශසීමා හරහා සිදු කරන වාණිජ භාණ්ඩ මෙහෙයුම් ද වැඩි කර ඇත. ජාතික ගුවන් සේවය වසර තුළ දී නව ගමනාන්ත කිහිපයක් වෙත ගුවන් ගමන් වැඩි කර ඇති අතර, එමගින් එහි ගුවන් යානාවල මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට උපකාරී වී ඇත. 2022 වසරේ මාර්තු මාසයේ ශ්‍රී ලංකාවේ පැවති සුප්‍රසිද්ධ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ඉසව්වක් සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවය නිල ගුවන් සේවා සහකරු වීම හරහා ශ්‍රීලංකන් ගුවන් සේවය ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන කටයුතුවල අඛණ්ඩව ක්‍රියාකාරීව නිරත විය.

**3.6 සංඛ්‍යා සටහන**

**ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2020 | 2021 (අ) | වර්ධන අනුපාතය % 2020 | වර්ධන අනුපාතය % 2021(අ) |
|---|---|---|---|---|
| **1. මගීන් (ගණන) (ආ)** | **2,372,928** | **1,500,078** | **-76.0** | **-36.8** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 1,237,931 | 857,158 | -77.8 | -30.8 |
| විදේශ ගුවන් සේවා | 1,134,997 | 642,920 | -73.7 | -43.4 |
| **2. භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො)** | **136,093** | **184,139** | **-44.8** | **35.3** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 56,151 | 93,195 | -54.3 | 66.0 |
| විදේශ ගුවන් සේවා | 79,942 | 90,944 | -35.3 | 13.8 |
| **3. ගුවන්යානා ගමනාගමනය (ගණන) (ඇ)** | **25,576** | **25,090** | **-74.0** | **-1.9** |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ | 24,931 | 24,336 | -74.3 | -2.4 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ | 505 | 722 | -60.9 | 43.0 |
| යාපනය ජාත්‍යාන්තර ගුවන් තොටුපොළ | 140 | 32 | -31.4 | -77.1 |

(අ) තාවකාලික
(ආ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
(ඇ) දේශීය ගුවන් ගමන් ඇතුළත් වේ

මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## වරාය සේවා

**වසංගතයට පෙර පැවති මට්ටම් ඉක්මවා ගිය මෙහෙයුම් ක්‍රියාකාරකම් මට්ටම් වාර්තා කරමින් 2021 වසරේ දී වරාය කටයුතු ශීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත් විය.** වසර ආරම්භයේ දී පසුබෑමක් පෙන්නුම් කළ ද, කොවිඩ්-19 ඩෙල්ටා ප්‍රභේදයේ ශීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් වරාය මෙහෙයුම් සඳහා යම් බාධා ඇති වූ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී හැර වසර පුරා වරාය ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් දක්නට ලැබුණි. ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම් ඉක්මවා යමින්, වසර තුළ දී අඩි විස්සේ බහලු ඒකක මිලියන 7.2කට සමාන බහලු ප්‍රමාණයක් සහ භාණ්ඩ මෙට්‍රික් ටොන් 109,369ක් මෙහෙයවනු ලැබීය. ඒ අනුව, කොළඹ වරායේ බහලු සහ භාණ්ඩ මෙහෙයුම්, පිළිවෙළින්, සියයට 5.8ක සහ සියයට 6.3ක වර්ධනයන් වාර්තා කළේය. තවද,

**3.7 සංඛ්‍යා සටහන**

**වරාය සේවා ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2020 | 2021 (අ) | වර්ධන අනුපාතය % 2020 | වර්ධන අනුපාතය % 2021(අ) |
|---|---|---|---|---|
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | 4,337 | 4,180 | -7.7 | -3.6 |
| කොළඹ | 3,806 | 3,675 | -9.3 | -3.4 |
| ගාල්ල | 22 | 14 | -48.8 | -36.4 |
| ත්‍රිකුණාමලය | 135 | 117 | -4.9 | -13.3 |
| හම්බන්තොට | 374 | 374 | 19.1 | - |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 102,908 | 109,369 | -3.8 | 6.3 |
| කොළඹ | 97,681 | 103,824 | -4.2 | 6.3 |
| ද.ආ.පි.ප. | 24,878 | 24,062 | -6.2 | -3.3 |
| කො.ජා.බ.ප. | 37,310 | 42,400 | 0.6 | 13.6 |
| ශ්‍රී ලං.ව.අ. | 35,493 | 37,362 | -7.4 | 5.3 |
| ගාල්ල | 404 | 106 | -20.8 | -73.8 |
| ත්‍රිකුණාමලය | 3,072 | 3,190 | -7.0 | 3.8 |
| හම්බන්තොට | 1,750 | 2,249 | 41.2 | 28.5 |
| 3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 6,855 | 7,249 | -5.2 | 5.8 |
| ද.ආ.පි.ප. | 1,872 | 1,839 | -8.8 | -1.8 |
| කො.ජා.බ.ප. | 2,885 | 3,212 | -0.3 | 11.3 |
| ශ්‍රී ලං.ව.අ. | 2,098 | 2,198 | -8.1 | 4.8 |
| 4. බහලු ප්‍රතිනැව්ගත කිරීම් (TEUs '000) (ආ) (ඇ) | 5,765 | 6,050 | -3.2 | 4.9 |
| ද.ආ.පි.ප. | 1,607 | 1,573 | -2.7 | -2.1 |
| කො.ජා.බ.ප. | 2,291 | 2,600 | -0.2 | 13.4 |
| ශ්‍රී ලං.ව.අ. | 1,867 | 1,877 | -7.0 | 0.6 |

(අ) තාවකාලික

(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක

(ඇ) නැවත ගබඩා කිරීම් ද ඇතුළත් ව


මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය (කො.ජා.බ.ප.) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) භාණ්ඩ මෙහෙයුම් සහ බහලු මෙහෙයුම් යන දෙඅංශයෙන්ම වර්ධනයන් වාර්තා කළ අතර, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.) මෙහෙයුම්වල සුළු පහළ යෑමක් වාර්තා කළේය. විශේෂයෙන් ම, කො.ජා.බ.ප. මීට දශකයකට පමණ පෙර වූ එහි ආරම්භයේ සිට මේ දක්වා වූ කාලය තුළ ප්‍රථම වතාවට අඩි විස්සේ බහලු ඒකක මිලියන 3කට අධික ප්‍රමාණයක් මෙහෙයවීය. කො.ජා.බ.ප., ශ්‍රී ලං.ව.අ. සහ ද.ආ.පි.ප. මගින් කොළඹ වරායේ මෙහෙයවනු ලැබූ සමස්ත බහලු ධාරිතාවය සඳහා, පිළිවෙළින්, සියයට 44.3ක, සියයට 30.3ක, සියයට 25.4ක දායකත්වයක් සැපයීය. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී විවෘත කරන ලද නැගෙනහිර බහලු පර්යන්තය (නැ.බ.ප.) මගින් මෙම වසර තුළ දී අඩි විස්සේ බහලු ඒකක 390,069කට සමාන බහලු ප්‍රමාණයක් හසුරවන ලදී. වරාය මෙහෙයුම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පැවතිය ද, විශාල නැව් වැඩි වශයෙන් පැමිණීම හේතුවෙන් සමස්ත නැව් පැමිණීම් සංඛ්‍යාව 2021 වසරේ දී පහළ යෑමක් වාර්තා කළේය. කලාපය තුළ ප්‍රධාන වරාය කේන්ද්‍රස්ථානයක් ලෙස නැගී සිටීම සඳහා කොළඹ වරායෙහි ඇති ඉහළ ශක්‍යතාව ඉස්මතු කරමින්, ලෝක බැංකුව සහ අයිඑච්එස් මාර්කිට් (IHS Markit) විසින් සම්පාදිත *බහාලුම් වරාය කාර්ය සාධන දර්ශකය* (Container Port Performance Index) (17 වන ස්ථානය) සහ වෙළඳ හා සංවර්ධන කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) විසින් සම්පාදිත *වරායයන් සඳහා වූ නිශ්චිත නාවික ගමනාගමන සම්බන්ධතා පිළිබඳ දර්ශකය* (Port Liner Shipping Connectivity Index) (17 වන ස්ථානය) වැනි ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් තුළ කොළඹ වරාය අඛණ්ඩව ඉහළ ස්ථානයන්හි ශ්‍රේණිගත විය.

**කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ වුව ද, වසර තුළ දී කොළඹ වරායේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වඩාත් ස්ථාවර ලෙස අඛණ්ඩව සිදු විය.** නැ.බ.ප.හි II අදියරේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ වූ අතර, බටහිර බහලු පර්යන්තය (බ.බ.ප.) සඳහා විදේශීය ආයෝජකයෙකු, දේශීය ආයෝජකයෙකු සහ ශ්‍රී ලං.ව.අ. අතර *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, අයිතිය පැවරීම පදනම් කර ගත් ගිවිසුමක්* (Built-Operate-Transfer agreement) වසර 35ක කාලයක් සඳහා අත්සන් කරන ලදී. නැ.බ.ප. සහ බ.බ.ප.යේ ඉදිකිරීම් කටයුතු, පිළිවෙළින්, 2025 සහ 2026 වන විට නිම කිරීම හරහා කොළඹ වරායේ ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. තවද, *ජාතික වරාය ප්‍රධාන සැලැස්මට* අනුව, නව වරාය සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ මූලික සැලසුම් සහ ශක්‍යතා අධ්‍යයනය 2021 වසරේ දී ආරම්භ විය. උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සහ සංචාරක කර්මාන්තය සඳහා අංග සම්පූර්ණ


**3.10 රූප සටහන**

**බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**3.11 රූප සටහන**
**වරාය ක්‍රියාකාරකම් වල ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය



වරායක් ලෙස ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අභිමතය විමසීමේ යෝජනා කැඳවීමට අදාළ කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක විය.

**දේශීය රථ වාහන මෙහෙයුම්වල ඉතා පහළ මට්ටමේ ක්‍රියාකාරීත්වයක් තිබියදීත්, මුළුමනින්ම රථ වාහන ප්‍රතිනැව්ගතකිරීම් හේතුකොටගෙන හම්බන්තොට වරායේ සමස්ත රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය එම වරායේ මෙහෙයුම් ආරම්භයේ සිට වාර්තා කළ ඉහළම වර්ධනය වාර්තා කරමින් 2021 වසරේ දී සියයට 40.4කින් ඉහළ ගියේය.** ඒ අනුව, හම්බන්තොට වරාය තුළ හසුරවන ලද සමස්ත රථ වාහන සංඛ්‍යාව 493,400ක් වූ අතර, එයින් 489,942ක් රථ වාහන ප්‍රතිනැව්ගත කිරීම් විය. රථ වාහන ප්‍රතිනැව්ගත කිරීම් සියයට 46.3ක වර්ධනයක් වාර්තා කළ අතර, අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන මෝටර් රථ ආනයන මත පැනවූ සීමා හේතුවෙන් දේශීය රථ වාහන මෙහෙයුම් සියයට 76.9ක දැඩි පහළ යෑමක් වාර්තා කළේය.

**2021 වසරේ වරාය කටයුතුවල ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලං.ව.අ. මූල්‍ය කාර්ය සාධනය වර්ධනය විය.** ඒ අනුව, 2020 වසරේ දී බිලියන 20.3ක් වූ ශ්‍රී ලං.ව.අ.හි බදුවලට පෙර ලාභය 2021 දී රු. බිලියන 25.6ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලං.ව.අ.හි සමස්ත ආදායම රුපියල් බිලියන 45.5ක් දක්වා සියයට 16.8කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම ද රුපියල් බිලියන 32.9ක් දක්වා සියයට 10.7කින් ඉහළ ගියේය.

## පණිවුඩ හුවමාරු සේවා

**කොවිඩ්-19 වසංගතය අඛණ්ඩව ව්‍යාප්ත වීමේ අභියෝග තුළින් පැන නැගුණු, ආර්ථිකයේ නූතන සන්නිවේදන අවශ්‍යතා සඳහා විශේෂයෙන්ම පහසුකම් සලසමින් විදුලි සංදේශ අංශය 2021 වසරේ දී අඛණ්ඩව පුළුල් විය.** 2020 වසරේ දී දක්නට ලැබුණු පරිදි, 2021 වසර තුළ දී ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා විදුලි සංදේශ අංශය අඛණ්ඩව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ආර්ථික ක්‍රියාකාරකම් රාශියක් සඳහා මාර්ගගත ක්‍රමවේද භාවිත කිරීම ඉහළ යෑම මෙම අංශයේ හිතකර වර්ධනය සඳහා හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දුරකථන සහ ජංගම දුරකථන ඝනත්වය වර්ධනය වීම හා සමගාමීව සමස්ත ජංගම දුරකථන සම්බන්ධතා, ස්ථාවර රැහැන් සහ රැහැන් රහිත දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ ගියේය.

***නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමවේදය* අනුගමනය කිරීම සහ අතථ්‍ය ඉගෙනුම් ක්‍රමවේද හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම හේතුවෙන් අන්තර්ජාල භාවිතයෙහි ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය.** ඒ අනුව, ජංගම සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා යන දෙඅංශයෙහිම ඉහළ යෑමත් සමඟ සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 26.9කින් වර්ධනය විය. තවද, ආර්ථික ක්‍රියාකාරකම් විශේෂයෙන්ම සේවා අංශයට අදාළ ක්‍රියාකාරකම්වල සිදු වූ ශීඝ්‍ර වෙනස්වීම් පිළිබිඹු කරමින් පුද්ගලයන් 100කට අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව මගින් ලබන අන්තර්ජාල ඝනත්වය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 79.9ට සාපේක්ෂව 2021 වසරේ දී 100.4ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල ව්‍යාප්ත වීමත් සමඟ 2020 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ඉහළ ගිය සමස්ත දත්ත භාවිතය, 2021 වසරේ මුල් භාගයේ සිට සංචරණ සීමා ඉවත් කිරීමට සමගාමීව 2021 වසරේ පළමු කාර්තුවේ දී ක්‍රමයෙන් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී වසංගතයේ තුන්වන රැල්ලෙහි ආරම්භයත් සමඟ සංචරණ සීමා පැනවීම සහ රැකියා සහ අධ්‍යාපන කටයුතු මාර්ගගත ක්‍රමවේද වෙත යොමු වීමත් සමඟ අන්තර්ජාල දත්ත භාවිතයෙහි ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබුණි. සංචරණ සීමා ඉවත් කිරීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2021 වසරේ ඔක්තෝබර් මාසයේ සිට අන්තර්ජාල දත්ත භාවිතයේ වර්ධන වේගය පහළ ගියේය.

**කොවිඩ්-19 වසංගතයෙන් පසු යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලිය හා සමගාමීව ඩිජිටල් පරිවර්තනයේ ඇති වැදගත්කම පිළිබඳ නිසි අවධානයක් යොමු කරමින්, *ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය (2021-2024)* ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළ ආරම්භ විය.** ඊට අදාළව, ඩිජිටල් රජය, ඩිජිටල් ආර්ථිකය සහ

**3.8 සංඛ්‍යා සටහන**

**විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2020 | 2021(අ) | වර්ධන අනුපාතය % 2020 | වර්ධන අනුපාතය % 2021(අ) |
|---|---|---|---|---|
| ස්ථාවර දුරකථන සේවා ('000) | 2,613 | 2,852 | 13.6 | 9.1 |
| රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව | 1,246 | 1,264 | 0.1 | 1.5 |
| රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව | 1,367 | 1,587 | 29.6 | 16.1 |
| ජංගම දුරකථන සංඛ්‍යාව ('000) | 28,739 | 29,959 | -12.6 | 4.2 |
| අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව (ආ) | 17,524 | 22,236 | 30.7 | 26.9 |
| පොදු දුරකථන කුටි සංඛ්‍යාව | 461 | ලැ.නො. | -3.2 | - |
| ඝනත්වය (ඇ) | | | | |
| ස්ථාවර දුරකථන | 11.9 | 12.9 | 13.0 | 8.0 |
| ජංගම දුරකථන | 131.1 | 135.2 | -13.1 | 3.1 |
| අන්තර්ජාලය (ආ) | 79.9 | 100.4 | 30.0 | 25.5 |

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඇ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දැක්වේ.


මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඩිජිටල් සේවා යන ප්‍රධාන අංශ තුනකින් සමන්විත මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත සිය අනුමැතිය ලබා දෙන ලදී. ඩිජිටල් රජය සහ ඩිජිටල් සේවා යන අංශ මගින් රජයේ ආයතන අතර ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඉලක්ක කරනු ඇති අතර, ඩිජිටල් ආර්ථිකය යන අංශයෙන්, ආර්ථිකයේ තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කර්මාන්තයෙන් වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 3ක අපනයන ආදායමක් උපයා ගැනීමට හැකි වන පරිදි දේශීය ධාරිතාව වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද, *ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය* ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව, ස්වාධීන සහ අපක්ෂපාතී පාලනයක් සහතික කිරීම සඳහා සියලුම ව්‍යාපෘති සහ වැඩසටහන් ඇතුළත් ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතියක් සංවර්ධනය කෙරෙමින් පවතී.

*ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගයට* අනුකූලව, රටෙහි පවතින ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව ඉලක්කගත වූ තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ද ප්‍රධාන පාර්ශ්ව ආයතනවල නායකත්වය යටතේ ක්‍රියාවට නංවන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් ග්‍රාම නිලධාරී වසම් 14,000ක් තුළ සිව්වන පරම්පරාවේ (4G) සම්බන්ධතා ආවරණය වැඩි දියුණු කිරීම සඳහා *ගමට සන්නිවේදනය* නමැති ජාතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘතිය මගින් 2024 වසර අවසන් වන විට මුළු දිවයිනම ආවරණය වන පරිදි 4G ආවරණය පුළුල් කර ගැනීමට ප්‍රයත්න දරන අතර, 2021 වසර අවසානයේ දී, දිස්ත්‍රික්ක දහයක ස්ථාන 251ක් තුළ මෙම ව්‍යාපෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු වෙමින් පැවතිණි. වසංගතය අතරතුර දුරස්ථ ඉගෙනුම් සඳහා පහසුකම් සැලසීම සහ ඒ සඳහා පුළුල් ප්‍රවේශයක් සහතික කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව *ඊ-තක්සලාව* සහ *LEARN* වැනි මංගත අධ්‍යාපනික ක්‍රමවේද සඳහා කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රවේශ අවස්ථාව සලසා දුන්නේය. ඉහළ යන පාරිභෝගික අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රධාන පියවර අතර, *සීමා රහිත අන්තර්ජාල සැලසුම්* සඳහා අනුමැතිය ලබා දීම සහ ග්‍රාහකයින් සඳහා *විවිධ විදුලි සංදේශ ජාල අතර මාරු වුවත් ජංගම දුරකථන අංකය නොවෙනස්ව භාවිත කිරීමේ හැකියාව* වැනි සේවා ලබා ගැනීමට නෛතික අනුමැතිය ලබා දීම ද ඇතුළත් විය. ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම, ඉඩම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල් කිරීම (eLand Registry), ඩිජිටල් සෞඛ්‍ය ව්‍යාපෘතිය, ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය, ලංකා රාජ්‍ය ජාලය 2.0 සහ ලංකා රජයේ ක්ලවුඩ් 2.0 වැනි ආර්ථිකයේ ඩිජිටල් පරිවර්තනයට අදාළ පියවර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අඛණ්ඩව මූලිකත්වය ගෙන කටයුතු කළේය. මෙම ක්‍රියාමාර්ගවලට අමතරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විද්‍යුත් තැපැල, වීඩියෝ සම්මන්ත්‍රණ සහ ඩිජිටල් ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමේ පහසුකම් ද සංවර්ධනය කළේය.


**3.12 රූප සටහන**

**දුරකථන ඝනත්වය**




මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**3.13 රූප සටහන**
**බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය**




මූලයන්: ඩයලොග් ඇක්සියාටා පොදු සීමිත සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම
මොබිටෙල් (පෞද්.) සමාගම
භාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්.) සමාගම

සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1


**වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා මධ්‍යයේ තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය අඛණ්ඩව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** වසංගතයේ තුන්වන රැල්ල සහ ඒ ආශ්‍රිත කොවිඩ්-19 පාලනය කිරීමේ සීමා හේතුවෙන් තැපැල් සේවාවලට බාධා ඇති වුව ද, 2021 වසරේ ජූනි මාසයේ දී රජය විසින් තැපැල් සේවා *අත්‍යවශ්‍ය සේවාවක්* ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟ තැපැල් දෙපාර්තමේන්තුව නව ප්‍රවේශයන් අනුගමනය කරමින් සිය සේවා අඛණ්ඩව සිදු කිරීමට පියවර ගත්තේය. 2020 වසර අග භාගයේ දී නැවත දියත් කරන ලද *ඇණවුම් ලැබුණු පසු මුදල් ගෙවීමේ සේවාව*, 2021 වසර තුළ දී ද රුපියල් මිලියන 34.0ක ආදායමක් උත්පාදනය කරමින් සාර්ථකව ඉදිරියට ගෙන ගියේය. මේ අතර, 2021 වසර තුළ දී රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සහ ධීවර විශ්‍රාම වැටුප් මෙන්ම, වෙනත් සමාජ සේවා දීමනා ගෙවීමට ද තැපැල් දෙපාර්තමේන්තුව අඛණ්ඩව පහසුකම් සැලසූ අතර, ඖෂධ නොමිලේ බෙදා හැරීමට ද පහසුකම් සැලසීය. දිවයින පුරා තැපැල් බෙදාහැරීමේ ප්‍රදේශ 8,157ක් ආවරණය වන පරිදි, ප්‍රධාන තැපැල් කාර්යාල 654ක්, උප තැපැල් කාර්යාල 3,410ක් සහ පෞද්ගලික තැපැල් කාර්යාල 130කින් සමන්විත තැපැල් දෙපාර්තමේන්තුවේ ජාලය හරහා කිසිදු බාධාවකින් තොරව ප්‍රධාන තැපැල් සේවාවන් සපයන ලදී. කෙසේ වෙතත්, දැනට සිදු වෙමින් පවතින ඩිජිටල් පරිවර්තනය සහ පාරිභෝගිකයින්ගේ ඉහළ යන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි තැපැල් දෙපාර්තමේන්තුව විසින් නව්‍ය අගය එකතු කළ සේවා සැපයීමෙහි අවශ්‍යතාව පිළිබිඹු කරමින්, 2020 වසරේ රුපියල් බිලියන 7.7ක් වූ අලාභයට සාපේක්ෂව 2021 වසරේ දී තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 7.2ක් වීම හේතුවෙන්, තැපැල් දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය තත්ත්වය අඛණ්ඩව දුර්වල විය.

## ජල සම්පාදනය හා වාරිමාර්ග

**2025 වසර වන විට සෑම නිවසකටම පිරිසිදු සහ ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රධාන ඉලක්කයක් ලෙස දක්වන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව 2021 වසර තුළ දී නව ජල සැපයුම් සම්බන්ධතා ලබාදීම අඛණ්ඩව සිදු කරන ලදී.** ඒ අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වසර තුළ දී නව ජල සැපයුම් සම්බන්ධතා 192,087ක් ලබා දී ඇති අතර, වසර අවසානය වන විට පැවති සමස්ත ජල සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.8කට ළඟා විය. මේ හේතුවෙන් 2020 වසර අවසානයේ සියයට 93.2ක්ව පැවති ගෘහ ඒකකවල ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය, 2021 වසර අවසානයේ දී සියයට 94.4ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, රට තුළ ආදායම් නූපදවන ජල පරිභෝජනය, 2020 වසරේ පැවති සියයට 24.6ට සාපේක්ෂව 2021 වසර තුළ දී සියයට 25.8ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මෙහෙයුම් සහ නඩත්තු වියදම් ඉහළ යෑම හේතුවෙන්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පෙර වසරේ වාර්තා කළ රුපියල් මිලියන 370.5ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී මෙම වසර තුළ රුපියල් බිලියන 3.1ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය.

**ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජල සම්පාදන අමාත්‍යාංශයේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.** ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ජනතාවට ලබා දුන් *සැමට ජලය* නම් ප්‍රමුඛ ප්‍රතිඥාව යටතේ ව්‍යාපෘති 118කට අදාළ භෞතික වැඩකටයුතු වසර තුළ දී ආරම්භ කරන ලදී. තවද, දිවයින පුරා ආරක්ෂිත පානීය ජල ධාරිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් යුත් ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම 33ක්, 2021 වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ප්‍රතිලාභීන් 97,700කට ආරක්ෂිත පානීය ජලය ලබා දෙමින් 2016 වසරේ ආරම්භ කරන ලද *දැදුරු ඔය* ජල සම්පාදන ව්‍යාපෘතිය වසර තුළ දී අවසන් කළ අතර, කිරම-කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය හා කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය ඇතුළු තවත් ව්‍යාපෘති කිහිපයකම කටයුතු 2021 වසරේ දී නිම

**3.14 රූප සටහන**
**ජල සැපයුම් තත්ත්වය**




මූලයː ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

කරන ලදී. 2021 වසර අවසානය වන විට යාපනය නගරය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සියයට 61ක ප්‍රගතියක් අත්කර ගත්තේය. මෙම ව්‍යාපෘතිය යටතේ, වසර තුළ දී, තලෛයඩි මුහුදු ජල පවිත්‍රාගාරය, නයිනතිව් මුහුදු ජල පවිත්‍රාගාරය සහ යාපනය - කිලිනොච්චි නගරයේ ජල සැපයුම් ජාලය ආශ්‍රිත කටයුතු ආරම්භ කරන ලදී. තවද, 2021 වසර අවසන් වන විට, මාතලේ දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල ආවරණය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 94ක් විය.

**කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වයට සහාය සැලසීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය අඛණ්ඩව සිදු කරන ලදී.** ඒ අනුව, කුඩාවිලච්චිය ජලාශය සහ දෙමටගල වැව ප්‍රතිසංස්කරණය කිරීම වැනි වෙනත් ව්‍යාපෘති කිහිපයක් සමඟ ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය ද ආරම්භ කෙරිණි. තවද, *ගම සමඟ පිළිසඳර* වැඩසටහන යටතේ ගන්නා ලද ප්‍රධාන පියවරක් ලෙස කුඩා ජන කණ්ඩායම් සඳහා වාරි ජලය සැපයීම දිවයිනේ විවිධ ප්‍රදේශවල අඛණ්ඩව පුළුල් කෙරිණි. වසර තුළ දී, රුපියල් බිලියන 5.6ක පිරිවැයක් වැය කරමින් ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති 26ක් ක්‍රියාත්මක කළ අතර, ඉන් යාන්ඔය සහ දැදුරුඔය ජලාශ ව්‍යාපෘති සඳහා වැය කළ මුදල, පිළිවෙළින්, රුපියල් බිලියන 2.7ක් සහ රුපියල් මිලියන 556.1ක් විය. මේ අතර, සියලුම දිස්ත්‍රික්ක පුරා ග්‍රාමීය වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම ඉලක්ක කරගත් *වාරි සෞභාග්‍යා* ජාතික වැඩසටහන ද 2021 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ කරන ලදී. ග්‍රාමීය වැව් 2,500ක් වැඩිදියුණු කිරීම තුළින් පුරන් කුඹුරු අක්කර 50,000ක් අස්වැද්දීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. අයහපත් දේශගුණික විපර්යාසවලට එරෙහිව ජල සම්පත් යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් 2014 වසරේ දී ආරම්භ කරන ලද දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 වසරේ දී නිම කරන ලදී. තවද, උමා ඔය පහළ ගංගාධාර ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් බිලියන 9.4 සිට රුපියල් බිලියන 17.9ක් දක්වා ඉහළ නැංවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. 2021 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය සියයට 65ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. තවද, ගොවි පවුල් 97,832කට ප්‍රතිලාභ සලසමින් වාරි ජලය අවශ්‍ය වන ඉඩම් හෙක්ටෙයාර් 72,882ක වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් 2017 වසරේ දී ආරම්භ කරන ලද ඵලදායීතාව නැංවීම සහ වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, වසංගතය මගින් ඇති වූ අවහිරතා හේතුවෙන් මන්දගාමී වේගයකින් වුව ද, අඛණ්ඩව ක්‍රියාවට නැංවිණි.

**3.9 සංඛ්‍යා සටහන**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය**

| ශීර්ෂය | 2020 | 2021(අ) | වර්ධන අනුපාතය % 2020 | වර්ධන අනුපාතය % 2021(අ) |
|---|---|---|---|---|
| මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ) | 331 | 337 | -4.9 | 1.8 |
| වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන | 122,733 | 192,087 | 12.8 | 56.5 |
| සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ) | 2,560,237 | 2,752,324 | 5.0 | 7.5 |
| මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන) | 782 | 815 | 4.8 | 4.2 |
| ආදායම් නූපදවන ජලය (ප්‍රතිශතය) | | | | |
| කොළඹ නගරය | 39.2 | 34.8 | -3.4 | -11.4 |
| සමස්ත දිවයින | 24.6 | 25.8 | -1.7 | 4.8 |
| පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ) | 93.2 | 94.4 | 1.4 | 1.3 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඈ) | 53.1 | 54.3 | 2.5 | 2.3 |

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වූ සංසන්දනාත්මක අගය සියයට 88.5 ක් වේ.
(ඈ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

මූලයː ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## 3.3 සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය


### සෞඛ්‍ය

**මූලික වශයෙන් ඩෙල්ටා ප්‍රභේදයේ ව්‍යාප්තිය සමඟ 2021 වසරේ දී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වුව ද, ගෝලීය වශයෙන් පිළිගත් එන්නත්කරණ වැඩසටහන ක්‍රියාවට නැංවීමට සමගාමීව රජය විසින් සුදුසු පරිදි සහ නිසි කලට සංචරණ සීමා පැනවීම හේතුවෙන් 2022 වසරේ මුල් භාගයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදය වැළඳුණු පුද්ගල සංඛ්‍යාව අඩු කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.** 2020 වසරේ මාර්තු සහ ඔක්තෝබර් යන මාසවල දී ඇති වූ කොවිඩ්-19 රැලි ද්විත්වයෙන් අනතුරුව, ශීඝ්‍රයෙන් බෝවන කොවිඩ්-19 ඩෙල්ටා ප්‍රභේදය හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වසංගතයේ තුන්වන රැල්ල ඇති විය. 2021 වසරේ අප්‍රේල් මාසය මැද දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ජනගහනයෙන් මිලියනයකට 11ක් වූ රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව, වසංගතයේ තුන්වන රැල්ලේ උච්චතම අවස්ථාව වන 2021 වසරේ අගෝස්තු මාසයේ දී දෛනිකව තහවුරු කරන ලද නව කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව මිලියනයකට 276ක් දක්වා ඉහළ ගියේය. වේගයෙන් පැතිර යන කොවිඩ්-19 වෛරසයෙහි ඩෙල්ටා ප්‍රභේදය මේ සඳහා හේතු විය. කෙසේ වෙතත්, 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී වසංගතයේ පළමු ව්‍යාප්තිය තුළ දී දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලද ආර්ථික හා සමාජ කටයුතු සම්පූර්ණයෙන්ම සීමා කිරීමේ ක්‍රියාමාර්ගවලට වෙනස්ව යමින්, සමස්ත සමාජ ආර්ථික යහපැවැත්ම සහතික කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව පවත්වාගෙන යෑමට පහසුකම් සලසමින්, වසංගතයේ තුන්වන රැල්ල තුළ දී වෛරසය පැතිරීම පාලනය සඳහා රජය සුපරික්ෂාකාරිව සංචරණ සීමා කිරීම් අනුගමනය කළේය. තුන්වන රැල්ලේ ආරම්භක අවධියේ දී, හඳුනාගත් සියලුම කොවිඩ් ආසාදිතයින් රෝහල්ගත කිරීමට හෝ වෙන්කර ඇති මධ්‍යස්ථානවල නිරෝධායනය කිරීමට කටයුතු කළ අතර, කොවිඩ් ආසාදිතයින්ගේ පළමු පෙළ ආශ්‍රිතයින් නිරෝධායන මධ්‍යස්ථානවල දී හෝ ඔවුන්ගේ නිවෙස්වල දී නිරෝධායනය කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, රෝගීන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් රෝහල්වල ඇති වන අධික තදබදය වැළැක්වීමේ ප්‍රයත්නයක් ලෙස, රජය ප්‍රමුඛතා පදනමක් මත කොවිඩ්-19 රෝගීන් රෝහල්ගත කිරීමට තීරණය කළේය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී කොවිඩ් මරණ අනුපාතිකයේ කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබීම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය අවසානය දක්වා රජය විසින් දිවයින පුරා ඇඳිරි නීතිය පැනවූ අතර, එම කාල සීමාව තුළ අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑමට අවසර ලබා දෙන ලදී. 2021 වසරේ ජූලි මාසය අග භාගයේ සිට වේගවත් වූ එන්නත්කරණ වැඩසටහනත් සමඟ, 2021 වසරේ සැප්තැම්බර් මාසය මැද භාගයේ සිට කොවිඩ්-19 මරණ සංඛ්‍යාවෙහි සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබීම හේතුවෙන් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම සංචරණ සීමා ඉවත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. 2021 වසරේ දෙසැම්බර් මාසයේ මුල් භාගයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදය හඳුනා ගැනීමෙන් අනතුරුව, 2022 වසරේ පෙබරවාරි මාසයේ මැද භාගයේ දී රෝගීන් සංඛ්‍යාව ජනගහනයෙන් මිලියනයකට 66ක් දක්වා අඛණ්ඩව ඉහළ යෑමක් දක්නට ලැබුණි. රෝගීන් සංඛ්‍යාවේ මෙවැනි ඉහළ යෑමක් පැවතිය ද, ජනගහනයෙන් සියයට 65ක් එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කර තිබීම සහ ජනගහනයෙන් සියයට 28ක් වර්ධක මාත්‍රාව (booster dose) ලබාගෙන තිබීමත් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේදී ජනගහනයෙන් මිලියනයකට මරණ 10ක් ලෙස වාර්තා වූ කොවිඩ් මරණ අනුපාතිකය හා සැසඳීමේ දී මෙම කාලපරිච්ඡේදය තුළ මරණ අනුපාතිකය ජනගහනයෙන් මිලියනයකට මරණ 2ක් දක්වා පහළ ගියේය. කොවිඩ් එන්නත්කරණ වැඩසටහනෙහි වේගවත් ප්‍රගතිය සැලකිල්ලට ගනිමින්, ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණයෙන් හෝ පී.සී.ආර්. පරීක්ෂණයෙන් කොවිඩ්-19 වැළඳුණු බවට තහවුරු වූ දිනට හෝ රෝග ලක්ෂණ මතු වූ දිනයේ සිට දින 7කට පසුව කොවිඩ් රෝගීන් හුදකලා බවින් නිදහස් කිරීමට ඉඩ සලසමින් සෞඛ්‍ය අමාත්‍යාංශය 2022 වසරේ ජනවාරි මාසය අග භාගයේ දී චක්‍රලේඛයක් නිකුත් කළේය. ඒ අනුව, කොවිඩ්-19 රෝග ලක්ෂණවලින් තොර පූර්ණ එන්නත්කරණයට ලක්ව ඇති සමීප ආශ්‍රිතයින් නිරෝධායනය කිරීම අවශ්‍ය නොවූ අතර, අර්ධ වශයෙන් එන්නත් කරන ලද හෝ එන්නත් නොකළ පුද්ගලයන් දින 7ක නිරෝධායන කාල සීමාවක් සම්පූර්ණ කිරීමෙන් පසු නිරෝධායනයෙන් නිදහස් කිරීමට හැකි විය. 2022 වසරේ මුල් භාගයේ දී, වයස අවුරුදු 12 ට වැඩි ළමුන් ඇතුළත් වන පරිදි එන්නත්කරණ වැඩසටහන පුළුල් කරන ලද අතර, ඒ යටතේ වයස අවුරුදු 12 - 15 අතර වයස් කාණ්ඩවල පිරිස් සඳහා ෆයිසර් එන්නතේ එක් මාත්‍රාවක් ලබා දෙන ලදී. 2022 වසරේ අප්‍රේල් මාසයේ 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොවිඩ්-19 වෛරසයට එරෙහිව පූර්ණ වශයෙන් එන්නත් කර ඇති බවට සාක්ෂි

නොමැති පුද්ගලයින්ට පොදු ස්ථානවලට ඇතුළු වීම වළක්වාලමින් 2022 වසරේ ජනවාරි මාසය අග භාගයේ දී අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. වසංගතය ආශ්‍රිත වියදම් සඳහා මුදල් කඩිනමින් වෙන් කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, 2021 වසර සඳහා වූ වසංගතය ආශ්‍රිත රජයේ සමස්ත වියදම රුපියල් බිලියන 165.6කි. මෙයින්, එන්නත්, නිරෝධායන පහසුකම්, සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම් සහ වෛද්‍ය සැපයුම් වැනි සෞඛ්‍ය අංශයට අදාළ වියදම රුපියල් බිලියන 130.1කි.

**වසංගතය ආශ්‍රිත අභියෝග මධ්‍යයේ, ශ්‍රී ලංකාව තවත් බෝවන රෝග පැතිරීම් පාලනය කිරීම සම්බන්ධයෙන් ද අඛණ්ඩව කටයුතු කළේය.** 2021 වසරේ දී ඩෙංගු රෝගීන් 23,853ක් වාර්තා වූ අතර, ඉන් සැලකිය යුතු පිරිසක් දෙසැම්බර් මාසයේ මෝසම් වැසි ආරම්භයත් සමඟ වාර්තා විය. ආසන්න වශයෙන් රෝගීන්ගෙන් සියයට 70ක් පමණ කොළඹ, මඩකලපුව, ගම්පහ, කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා විය. 2022 වසරේ ආරම්භක මාස තුන තුළ ඩෙංගු රෝගීන් 8,000කට අධික සංඛ්‍යාවක් හඳුනා ගැනීමත් සමඟ ඩෙංගු රෝගය ඉහළ යෑමේ ප්‍රවණතාවක් අඛණ්ඩව පැවති අතර, විශේෂයෙන් ම සාපේක්ෂව අඩු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වීමෙන් අනතුරුව, ඩෙංගු රෝගය යළි හිස එසවීම පිළිබඳ අවදානමක් මතු කර ඇත. ඩෙංගු රෝගීන් ඉහළ යෑමේ ප්‍රවණතාව අඩු වීම සඳහා කොවිඩ්-19 සංචරණ සීමා හේතුවෙන් ජනතාවට නිවාස තුළ රැඳී සිටීමට සිදු වීමත් සමඟ ඔවුන්ට අවට පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමට සහ තම නිවාස පරිශ්‍රය මදුරුවන් බෝවීමකින් තොරව තබා ගැනීමට හැකි වීම හේතු විය. පුද්ගල සනීපාරක්ෂාව පිළිබඳ පුද්ගලයන් අතර දැනුම්වත්භාවය ඉහළ යෑම, විශේෂයෙන්ම මුව

**3.15 රූප සටහන**
**කොවිඩ් - 19 එන්නත්කරණයෙහි ප්‍රගතිය**




මූලයː සෞඛ්‍ය අමාත්‍යාංශය

ආවරණ භාවිතය වැඩි වීම හේතුවෙන් සුපුරුදු ඍතුමය ඉන්ෆ්ලුවෙන්සා වසංගත තත්ත්වය මෙම වසර තුළ දී දක්නට නොලැබිණි. 2021 වසරේ දී හඳුනාගත් මී උණ රෝගීන් සංඛ්‍යාව, 2020 වසරේ දී වාර්තා වූ රෝගීන් 8,579ට සාපේක්ෂව 6,855ක් විය.

**සෞඛ්‍ය අංශයට කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද බලපෑම් මධ්‍යයේ වුව ද, බෝ නොවන රෝගවලින් පීඩා විඳින පුද්ගලයන්ට සහ ඉලක්කගත සෞඛ්‍ය රැකවරණයක් අවශ්‍ය ජන කොටස් සඳහා අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සහතික කිරීමට රජය කැපවී සිටියේය.** ඒ අනුව, අඛණ්ඩව ඖෂධ සැපයීම සහතික කිරීම සහ රෝගීන් පසු විපරම් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, දිස්ත්‍රික් මට්ටමේ වෛද්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදු කළේය. 2020 වසරේ දී මෙන්ම, සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය, සෞඛ්‍ය අංශයේ නොවන රාජ්‍ය නිලධාරීන් සහ තැපැල හරහා ඖෂධ බෙදා හැරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කළේය. ඖෂධ මිලදී ගැනීම සහ නිවෙස් වෙත බෙදාහැරීම පහසු කිරීම සඳහා ඔසුසල් හිමියන්ගේ සංගමය සමඟ එක්ව වෙබ් පාදක යාන්ත්‍රණයක් ද ස්ථාපිත කරන ලදී. තවද, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට අනුගත වීම, බෝ නොවන රෝග පාලනය කිරීම, පූර්ව අනතුරු ඇඟවීමේ සලකුණු හඳුනා ගැනීම සහ හදිසි අවස්ථාවක දී වෛද්‍ය සේවා ලබා ගැනීමේ ක්‍රම සහ විධි පිළිබඳව ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා දැනුම්වත් කිරීමේ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සිදු කළේය. විශේෂයෙන් ම, කොවිඩ්-19 වැළඳුණු ගර්භනී මව්වරුන් සහ දරුවන් සඳහා ප්‍රජනන, මාතෘ, අලුත උපන්, ළමා, නව යොවුන් සහ තරුණ සෞඛ්‍ය රැකවරණය ලබා දීම හරහා වසංගතය තුළ අවදානමට ලක්විය හැකි මාතෘ සහ ළමා කොටස්වල සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මූලිකත්වය ගෙන කටයුතු කළේය. කොවිඩ් රෝගයේ බලපෑම අවම කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස ගර්භනී මව්වරුන් කොවිඩ්-19 වෛරසයට එරෙහිව එන්නත්කරණයට ලක් කළ දකුණු ආසියාවේ පළමු රට ශ්‍රී ලංකාව විය. ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින පෝෂණ ඌනතාව, අධි බර හෝ ස්ථුලභාවය සහ ක්ෂුද්‍ර පෝෂක ඌනතාව යන මන්දපෝෂණයේ ත්‍රිත්ව බලපෑම සැලකිල්ලට ගනිමින්, දිස්ත්‍රික් මට්ටමින් විශේෂිත ඉලක්කගත මැදිහත්වීම් හරහා මෙම ගැටලු මඟහරවා ගැනීමට කටයුතු කරන ලදී.

**වසර තුළ දී, රජයේ සෞඛ්‍ය සේවා පද්ධතියට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවිණි.** ඒ අනුව, සෞඛ්‍ය සේවා ආයතන 9ක්

3

**3.10 සංඛ්‍යා සටහන**

**සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) |
|---|---|---|
| 1. රාජ්‍ය අංශය | | |
| රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය) | 609 | 618 |
| ඇඳන් සංඛ්‍යාව | 77,121 | 78,228 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 514 | 542 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව | 18,218 | 18,992 |
| සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව | 690 | 650 |
| හෙද සේවක සංඛ්‍යාව | 37,133 | 38,743 |
| උපස්ථායක සංඛ්‍යාව | 8,177 | 8,176 |
| 2. ආයුර්වේද | | |
| රෝහල් සංඛ්‍යාව | 118 | 118 |
| ඇඳන් සංඛ්‍යාව | 5,022 | 5,444 |
| සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව | 1,749 | 1,806 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ) | 26,061 | 26,183 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්

මූලයන්: සෞඛ්‍ය අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වැඩිදියුණු කර නැවත වර්ගීකරණය කරන ලද අතර, නව ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 27ක් පිහිටුවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී. 2021 වසර තුළ දී, මාතර නව දිස්ත්‍රික්ක මහ රෝහල සඳහා අතිරේක ගොඩනැගිලි ඉදිකිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, එම ව්‍යාපෘතිය සියයට 90ක භෞතික ප්‍රගතියක් ද අත්කරගෙන ඇත. මීට අමතරව, කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකයේ භෞතික යටිතල පහසුකම් පුළුල් කිරීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශට අයත් රෝහල් 28ක හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර වාට්ටුවල පහසුකම් වැඩි කිරීම ශක්තිමත් කිරීම සහ ක්‍රමවත් කිරීම ද වසර තුළ දී සිදු විය.

**විශේෂයෙන් ම කොවිඩ්-19 වසංගතය මගින් රාජ්‍ය සෞඛ්‍ය සේවා අංශය වෙත එල්ල වූ පීඩනය සමනය කිරීමෙහිලා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.** විශේෂයෙන් ම වසංගතය හේතුවෙන් ජනතාවගේ ඉහළ යන අවශ්‍යතා සපුරාලීම සඳහා නව්‍ය සේවා සැපයීමේ දී පෞද්ගලික රෝහල් මූලිකත්වය ගෙන තිබේ. පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් හරහා දැරිය හැකි මිලකට දුරකථන මාර්ග හරහා වෛද්‍ය උපදෙස් සේවා ලබා ගැනීමට ඇති හැකියාව ඉහළ යෑම හේතුවෙන් විදුලි සංදේශ තාක්ෂණය භාවිතයෙන් වෛද්‍යවරුන්ගෙන් රෝග ඇගයීම්, රෝග විනිශ්චයන් සහ ප්‍රතිකාර ලබා ගැනීමට රෝගීන්හට අවකාශය ලැබිණි. කොවිඩ්-19 ආශ්‍රිත පරීක්ෂණ සේවා සහ ප්‍රතිකාරවලට අමතරව, අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන නිසිකලට සැපයීම හරහා කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය සඳහා පුද්ගලික රෝහල් ද සුවිශාල කාර්යභාරයක් ඉටු කර ඇත. පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් විසින් සිය සේවා සැපයීම ඉහළ නැංවීම හේතුවෙන්, පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශයක් නොමැති පුද්ගලයන් සහ ජනගහනය තුළ සිටින පීඩිත ජන කොටස සඳහා රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පවතින ඉඩ ප්‍රස්ථාව අහිමි වී යෑම වැළැක්විණි. 2021 වසර අවසානය වන විට, පෞද්ගලික සෞඛ්‍ය සේවා පද්ධතිය රෝහල් ඇඳන් 5,444ක ධාරිතාවයකින් යුතු රෝහල් 233කින් සමන්විත විය.

## අධ්‍යාපනය

**ඵලදායී පුරවැසියන් සහ ශක්තිමත් මානව සම්පත් පදනමක් නිර්මාණය කිරීම සඳහා වූ රජයේ දැක්මට අනුව යමින්, අධ්‍යාපන අමාත්‍යාංශය ආර්ථිකයේ මානව ප්‍රාග්ධන පදනමේ ඵලදායී විභවයන් නංවාලීමේ කාර්යයෙහි නිරත විය.** ඒ අනුව, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධීන්හි දී *සැමට අධ්‍යාපනය* යන මූලධර්මය අනුව පළාත් අධ්‍යාපන බලධාරීන් සහ ජාතික මට්ටමේ අධ්‍යාපන ආයතන සමග එක්ව අධ්‍යාපන අමාත්‍යාංශය 2021-2025 කාල පරිච්ඡේදය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සංවර්ධනය කළේය. අධ්‍යාපනයේ සමානාත්මතාවය ශක්තිමත් කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, සාමාන්‍ය අධ්‍යාපනයේ කළමනාකාරීත්වය හා සේවා සැපයීම ශක්තිමත් කිරීම මෙන්ම, දත්ත සහ තොරතුරු පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා සැලසුම් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර හතර යටතේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වන මැදි කාලීන සැලැස්ම සකස් කර ඇත. නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන වැනි වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක විය. දීපව්‍යාප්තව පිහිටි ජාතික පාසල් සංඛ්‍යාව 1,204ක් දක්වා ඉහළ නැංවීම සඳහා තෝරාගත් පාසල් 831ක් 'ජාතික පාසල්' කාණ්ඩයට වැඩිදියුණු කිරීම නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන මගින් සිදු කෙරේ. වසර තුළ දී, මෙම වැඩසටහන සඳහා රුපියල් බිලියන 1.9ක් වෙන් කරන ලද අතර, තෝරාගත් සෑම පාසලකටම භෞතික හා ඉගෙනුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2.0 බැගින් ලබා දීම සිදු විය. එහි පළමු පියවර ලෙස 2021 වසරේ මුල් කාලයේ දී පාසල් 09ක් ජාතික පාසල් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඉගෙනුම් ප්‍රතිඵල සම්බන්ධයෙන් ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව, සක්‍රීය අධ්‍යාපනය පිළිබඳව ඉහළ අවධානයක්

යොමු කරමින්, ජාතික අධ්‍යාපන ආයතනය, *ගැටලු විශ්ලේෂණය මත පදනම් වූ ඉගෙනුම* යන තේමාව යටතේ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සඳහා නව විෂය මාලාවක් සකස් කළ අතර, එම තේමාව යටතේ වන ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීමට ගුරු පුහුණු මොඩියුල සහ අත්පොත් ද නිසි ආකාරයට සකස් කළේය. උසස් පෙළ සඳහා පස්වන විෂය ධාරාව වශයෙන් *තාක්ෂණවේදය* විෂය ධාරාව හඳුන්වාදීමේ වැඩසටහන 2021 වසරේ දී අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය අතර, මෙම වැඩසටහන සඳහා අලුතින් පාසල් 09ක් එක් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසර අවසානයේ දී පාසල් 466ක තාක්ෂණ විෂය ධාරාව උගන්වනු ලැබීය. මේ අතර, දිවයින පුරා පාසල් 523ක උසස් පෙළ විෂයන් සඳහා වෘත්තීය විෂය ධාරාව ඇතුළත් කරමින් *වසර 13ක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය* 2021 වසර තුළ දී තවදුරටත් වැඩිදියුණු කරන ලදී. විශේෂයෙන්ම, *වෘත්තීය* විෂය ධාරාව යටතේ ලියාපදිංචි වූ සිසුන් 9,603 අතරින් ආසන්න වශයෙන් සියයට 87ක පිරිසක් එවැනි විකල්ප අධ්‍යාපන අවස්ථාවක් නොමැති විට, අධ්‍යාපන පද්ධතියෙන් ඉවත්ව යෑමේ අවදානමට ලක්විය හැකි බවට හඳුනාගෙන ඇත. වසර තුළ දී, මෙම විෂය ධාරාව යටතේ අධ්‍යාපනය ලබමින් සිටි සිසුන් 11,000ක් පමණ ආයතනික පුහුණුව සඳහා යොමු කරන ලදී. තවද, පෙර වසරවලදී මෙම විෂය ධාරාව යටතේ ලියාපදිංචි වූ සිසුන් 6,390ක් ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualifications) 04 වන මට්ටම සම්පූර්ණ කර ඇති අතර, එම සිසුන් සංචාරක සහ ආගන්තුක සත්කාර, මෝටර් රථ/විදුලි කාර්මික සේවා, උපස්ථායක/ක්‍රීඩා, තොරතුරු තාක්ෂණ, ඉදිකිරීම් සහ කෘෂිකර්මාන්තය හා වැවිලි කර්මාන්තය වැනි කර්මාන්ත කිහිපයක රැකියා වෙත අන්තර්ග්‍රහණය කර ඇත. 2022 වසර තුළ දී මෙම වැඩසටහන තවත් පාසල් 78ක් දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

**වසර තුළ දී පාසල් වරින්වර වසා දැමීම හේතුවෙන් කොවිඩ්-19 වසංගතයේ අභියෝග ජය ගනිමින් සාමාන්‍ය අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යෑම සඳහා විවිධ නව ක්‍රමවේද අනුගමනය කිරීමට අවශ්‍ය විය.** 2021 වසරේ මාර්තු මාසයේ සහ 2021 වසරේ අවසාන කාර්තුවේ දී ඉතා කෙටි කාලයක් සඳහා සුපුරුදු අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම හැරුණු විට, 2021 වසරේ වැඩි කාලයක් තුළ පාසල් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් වසා දමා තිබුණි. පාසල් විවෘත කර තිබූ මෙම කෙටි කාලසීමා තුළ පාසල් පරිශ්‍රය තුළ සිටින ළමුන්, ගුරුවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. පන්ති කාමර නිතිපතා විෂබීජහරණය කිරීම, දෑත් සේදීමේ පහසුකම් ලබා දීම, භෞතික වශයෙන් දුරස්ථ පන්ති කාමර සැකසීම සහ සිසුන් ආරක්ෂිත ලෙස ප්‍රවාහනය කිරීම සඳහා විධිවිධාන සම්බන්ධීකරණය කිරීම එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග අතර විය. වසර අවසාන භාගයේ දී, වයස අවුරුදු 16ට වැඩි සිසුන් ද ආවරණය වන පරිදි එන්නත්කරණ වැඩසටහන පුළුල් කරන අතර, ගුරුවරුන් එන්නත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සෞඛ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගයකින් යුතුව කටයුතු කළේය. පාසල් වසා දැමූ කාලපරිච්ඡේදය තුළ අඛණ්ඩව දෙවන වසර සඳහාත් ද්වී මුහුණුවරකින් යුතු යාන්ත්‍රණ හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම සහතික කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රයත්න දැරුවේය. 2020 වසර තුළ ක්‍රියාත්මක වූ මංගත වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම සහ තවදුරටත් පුළුල් කිරීම මෙම යාන්ත්‍රණවල ප්‍රධාන අංගයක් විය. ඒ අනුව, *ගුරු ගෙදර* අධ්‍යාපනික වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයෙන්ම අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කරන ලද අතර, පාසල්වල සියලුම ශ්‍රේණි සඳහා අතිරේක අධ්‍යාපනික කරුණු එක් කරමින් ජාතික විද්‍යුත් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වන *ඊ-තක්සලාව* පුළුල් කරන ලදී. මෙම අධ්‍යාපනික වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කරමින් එය ශ්‍රව්‍ය මාධ්‍යයෙන් ජාතික ගුවන්විදුලි නාලිකා හරහා ප්‍රචාරය කිරීමට ද වසර තුළදී කටයුතු කරන ලදී. 2021 වසර තුළ දී විශේෂයෙන්ම, ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල තාක්ෂණික සහ අන්තර්ජාල යටිතල පහසුකම් අවම වීම කෙරෙහි නිසි අවධානය යොමු කරමින්, *ගුරු ගෙදර* වැඩසටහන මගින් ශ්‍රව්‍ය මාධ්‍යයෙන් විකාශනය කෙරෙන අධ්‍යාපනික කරුණු සඳහා දවසේ ඕනෑම වේලාවක ප්‍රවේශ වීමට අවකාශය ලබා දෙමින් *රේඩියෝ ඊ-තක්සලාව* ජංගම යෙදුම සංවර්ධනය කරන ලදී. මේ අතර, දැනට පවතින මංගත ඉගෙනුම් පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති සිසුන්හට පහසුකම් සැලසීම සඳහා දුර බැහැර ප්‍රදේශවල කලාපීය දුරස්ථ ඉගෙනුම් අධ්‍යාපන මධ්‍යස්ථාන 2,000කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කරන ලදී. ඉගෙනුම් පරිසරයන් තුළ මුහුණට මුහුණලා සිදු කෙරෙන අන්තර්ක්‍රියා අවම වීම මධ්‍යයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල දුර්වල වීමේ අවදානමකට මුහුණ

3

දීමට පවතින වැඩි ඉඩ ප්‍රස්ථාව සැලකිල්ලට ගනිමින්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් ඇගයීම සඳහා නව අධ්‍යාපනික ඇගයීම් ක්‍රමයක් වසර තුළදී හඳුන්වා දුන් අතර, එමගින් එවැනි දරුවන් සඳහා තනි පුද්ගල අධ්‍යාපන සැලසුම් (Individual Education Plans) නිර්මාණය කිරීම සිදු විය. කොවිඩ්-19 වසංගතය මගින් ඇති වූ අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් ජාතික මට්ටමේ විභාග කිහිපයක් ප්‍රමාද වුවද, එම විභාග 2022 වසරේ දී පැවැත්වීමට කඩිනමින් සැලසුම් සකස් කරන ලදී. ඒ අනුව, 2021 වසරේ අගෝස්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය කල් දැමීමෙන් අනතුරුව එම විභාග, පිළිවෙළින්, 2022 වසරේ ජනවාරි සහ පෙබරවාරි යන මාසවලදී පැවැත්වූ අතර, සාමාන්‍ය පෙළ විභාගය 2022 වසරේ මැයි මාසය දක්වා කල් තබන ලදී

**සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා වන අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ කැපවීම, විශේෂයෙන්ම අධ්‍යාපනික ක්‍රියාකාරකම් මංගත ක්‍රමවේද වෙත ශීඝ්‍රයෙන් මාරු කිරීමට ගත් ක්‍රියාමාර්ග ඉතා ප්‍රශංසනීය වුවද, තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීමට ඇති දුෂ්කරතා සහ අදාළ සාක්ෂරතා මට්ටම්වල පවතින විෂමතා හේතුවෙන්, එවැනි ක්‍රියා මගින් අධ්‍යාපන ප්‍රතිඵලවල පවතින අසමානතා තවදුරටත් උග්‍ර කිරීමට වැඩි අවස්ථාවක් පවතින බව නිසි පරිදි හඳුනා ගැනීම වැදගත්ය.** තවද, පන්ති කාමර සහ රසායනාගාර තුළ දී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී ගුරුවරුන් සහ සම වයසේ මිතුරන් සමඟ සම්බන්ධ වන විට දක්නට ලැබෙන එම ක්‍රියාකාරකම්වලටම අනන්‍ය වූ භෞතික අන්තර්ක්‍රියා නොමැතිවීම හේතුවෙන් ඇතිවන ගැටලු මගින් මංගත ඉගෙනුම් ප්‍රතිඵල දුර්වල කළ හැකි හෙයින් මංගත ඉගෙනුම් ප්‍රතිඵලවල ගුණාත්මකභාවය ඇගයීම කළ යුතු වේ. මෙවැනි ඉගෙනුම් පරතරයන් මගින් දරුවන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල කෙරෙහි දිගුකාලීන බලපෑම් ඇති කිරීමට ඉඩ ඇති අතර, එය දරුවන්ගේ කුසලතා, හැකියාවන් සහ දැනුම සම්බන්ධයෙන් සැලකිය යුතු අන්දමේ විෂමතා නිර්මාණය කිරීමේ හැකියාවක් පවතී. පසුගිය වසර දෙක තුළ දී සිසු දරුවන් ලබාගත් අධ්‍යාපනයේ ඉගෙනුම් ප්‍රතිඵලවල සිදුවිය හැකි දුර්වල වීම් පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් විසින් පූර්වෝපායික ඇගයීම් සිදු කළ යුතු අතර, ළමයින් සාමාන්‍ය පරිදි පාසල් වෙත නැවත පැමිණීමත් සමඟ මෙම ඉගෙනුම් පරතරයන් පිරවීම සඳහා අවධානය යොමු වූ සහ ඉලක්කගත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. එසේම, කොවිඩ්-19 වසංගතය මගින් නිර්මාණය කළ අවශ්‍යතා සපුරාලීම සඳහා සංවර්ධනය කර ඇති මංගත අධ්‍යාපන යටිතල පහසුකම් හරහා අත්‍යවශ්‍ය සම්පත් වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීමට සහ නොමිලේ ලබා ගැනීමට පවතින ඉඩකඩ වර්ධනය වීම හේතුවෙන් රටේ අධ්‍යාපන යටිතල පහසුකම්වල දැනට පවතින විෂමතා අවම කිරීමට දායක විය හැකි බැවින් එවැනි යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යැමට රජය විසින් පියවර ගැනීම ඉතා වැදගත් වේ.

### 3.11 සංඛ්‍යා සටහන
### සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) |
|---|---|---|
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 11,091 | 11,095 |
| රජයේ පාසල් | 10,155 | 10,152 |
| ප්‍රාථමික පාසල් | 3,884 | 3,883 |
| ද්විතීයික පාසල් | 6,271 | 6,269 |
| ඉන්, ජාතික පාසල් | 373 | 383 |
| වෙනත් පාසල් | 936 | 943 |
| පිරිවෙන් | 816 | 819 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 120 | 124 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඈ) | 4,272,289 | 4,238,760 |
| රජයේ පාසල් | 4,063,685 | 4,032,211 |
| වෙනත් පාසල් | 208,604 | 206,549 |
| පිරිවෙන් | 69,878 | 69,500 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 138,726 | 137,049 |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 3. මුළු ගුරුවරු සංඛ්‍යාව (ඈ) | 265,394 | 264,215 |
| රජයේ පාසල් | 249,494 | 248,500 |
| වෙනත් පාසල් | 15,900 | 15,715 |
| පිරිවෙන් | 7,336 | 7,400 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 8,564 | 8,315 |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 4. නව ඇතුළත්කර ගැනීම් (ඉ) | 319,405 | 307,415 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | | |
| රජයේ පාසල් | 16 | 16 |
| වෙනත් පාසල් | 13 | 13 |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි) | 94.04 | 94.39 |
| 7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි) | 91.68 | 91.46 |
| 8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) | ලැ.නො. | ලැ.නො. |
| 9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 8 | 8 |
| 10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව | 973 | 973 |
| 11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 19 | 19 |
| පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව | 12,331 | 12,037 |
| වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව | 3,864 | 4,447 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ).

(ඈ) ජාත්‍යන්තර පාසල් වල දත්ත ඇතුළත් නොවේ.

(ඉ) රජයේ පාසල් සඳහා පමණි.

මූලය: අධ්‍යාපන අමාත්‍යාංශය

**2021 වසර තුළ දී උසස් අධ්‍යාපන කටයුතු දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද හරහා අඛණ්ඩව සිදු කරගෙන යෑමට රජය කටයුතු කළේය.** වසර තුළ දී රාජ්‍ය විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපන කටයුතු 2020 වසරේ මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වූ *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය* (LEARN) නම් මංගත අධ්‍යාපන ක්‍රමය හරහා සිදු කරන ලදී. *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය මංගත අධ්‍යාපන ක්‍රමය* යටතේ විශ්වවිද්‍යාල සිසුන්ට සහ කථිකාචාර්යවරුන්ට නොමිලේ දත්ත සඳහා ප්‍රවේශය ලබා දී ඇති අතර, මංගත මාර්ග ඔස්සේ දේශන පවත්වන ලදී. 2021 වසර තුළ, ඇතැම් අවස්ථාවල දී දිනකට සිසුන් 250,000ක් පමණ මෙම මංගත දේශන සඳහා සහභාගි වී ඇති අතර, ඉන් 100,000ක් මෙම මංගත අධ්‍යාපන ක්‍රමවේදය එකම අවස්ථාවකදී භාවිත කර ඇත. මේ අතර, මංගත අධ්‍යාපන සේවාවල ගුණාත්මකභාවය සහතික කිරීමේ අරමුණින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී

### 3.12 සංඛ්‍යා සටහන
### විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)

| ශීර්ෂය | 2020 (ආ) | 2021 (ඇ) |
|---|---|---|
| 1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව | 15 | 17 |
| 2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | 20 | 19 |
| 3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ) | | |
| විශ්වවිද්‍යාල (ඉ) | 106,641 | 118,711 |
| ආයතන | 3,844 | 3,610 |
| විවෘත විශ්වවිද්‍යාලය | 26,255 | 25,329 |
| 4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල) | | |
| අධ්‍යයන | 6,525 | 6,742 |
| අනධ්‍යයන | 12,821 | 12,971 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | 18.8 | 19.7 |
| 6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත් වීමේ අනුපාතය (අවුරුදු 19-23) (ඇ) | 8.2 | 8.7 |
| 7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම | | |
| ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%) | 62.42 | 62.44 |
| සුදුසුකම් ලැබූවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%) | 22.98 | 22.49 |
| 8. උපාධිලත් සංඛ්‍යාව (ඊ) | 32,066 | ලැ.නො. |
| ප්‍රථම උපාධි | 24,565 | ලැ.නො. |
| පශ්චාත් උපාධි | 7,501 | ලැ.නො. |
| 9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත් වීම (උ) | 41,669 | ලැ.නො. |
| 10. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සුදුසකම් ලැබූ සංඛ්‍යාව | 181,206 | 194,297 |

මූලය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ.
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.
(ඊ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ.
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.

### 3.13 සංඛ්‍යා සටහන
### තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2020 | 2021 (අ) |
|---|---|---|
| 1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ) | **1,239** | **1,071** |
| රාජ්‍ය | 570 | 478 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 669 | 593 |
| 2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව | **3,413** | **3,014** |
| රාජ්‍ය | 2,900 | 2,387 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 513 | 627 |
| 3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව | **47,621** | **45,033** |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 8,670 | 4,633 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 8,266 | 7,441 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 15,608 | 17,253 |
| ජාතික තරුණ සේවා සභාව | 2,118 | 3,897 |
| පෞද්ගලික ආයතන | 12,959 | 11,809 |

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් යුතුව *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාල ඉගෙනුම් ක්‍රමවේදයෙහි* ප්‍රගතිය අඛණ්ඩව සමාලෝචනය කළේය.

**රටේ තෘතීයික අධ්‍යාපන යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.** ඒ අනුව, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ වවුනියාව විශ්වවිද්‍යාලය යනුවෙන් නව විශ්වවිද්‍යාල ද්විත්වයක් වසර තුළ දී ස්ථාපිත කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, උපාධි පාඨමාලා 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 08ක් පිරිනැමීමේ පහසුකම් සහිත අධ්‍යයන අංශ 13කින් හා පීඨ 04කින් සමන්විත අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස 2021 වසරේ මාර්තු මාසයේ දී උසස් කරන ලදී. යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය 2021 වසරේ අගෝස්තු මාසයේදී වවුනියාව විශ්වවිද්‍යාලය ලෙසට උසස් කරන ලද අතර, ව්‍යාපාර අධ්‍යයනය, ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණ යන අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළව උසස් මට්ටමේ තෘතීයික අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීමට ඉන් අපේක්ෂා කෙරේ. මීට අමතරව, ජාතික හෙද විශ්වවිද්‍යාලයක් සහ ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ජාතික විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කර ඇත. 2020/21 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල කිහිපයක් සඳහා නව පාඨමාලා 16ක් හඳුන්වා දෙන ලදී.

**පෞද්ගලික අංශය ද රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අවස්ථා පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීය.** ඒ අනුව, 2021 වසර අවසානය වන විට උපාධි පිරිනැමීමේ ආයතන ලෙස පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 21ක් විය. 2021 වසර තුළ දී රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන ප්‍රතීතනය ලත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව, 2020 වසරේ දී පැවති 167ක සිට 190ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එමගින් සිසුන්ට පෞද්ගලික අංශය හරහා විවිධ අධ්‍යයන ධාරා යටතේ උසස් අධ්‍යාපනය හැදෑරීමට වැඩි අවස්ථා හිමි කර දී ඇත. මේ අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ අරමුණින් යුතුව, එම ආයතන නැවත ඇගයීම සඳහා පස් අවුරුදු මාර්ගෝපදේශයක් සැකසීමට අධ්‍යාපන අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කළ අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය කිරීම සහ එම ආයතනවල වැඩසටහන් සමාලෝචනය කිරීම සඳහා වන අවම ප්‍රමිතීන් හඳුන්වාදීම සම්බන්ධ කටයුතු ද වසර තුළ දී සිදු වෙමින් පැවතුණි.

**ආර්ථිකයේ ඉහළ යන අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රම බලකායේ නිපුණතා මට්ටම් ඉහළ නැංවීමේ අරමුණින් යුතුව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය 2021 වසර තුළ දී අධ්‍යාපන අවස්ථා ලබා දීමට අඛණ්ඩව කටයුතු කළේය.** 2021 වසරේ දෙසැම්බර් අවසානය වන විට, රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනවලින් සමන්විත, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපනය ලබාදීමේ නිරත ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 1,071ක් විය. මෙම පුළුල් ආයතන ජාලය හරහා ප්‍රතීතනය කළ පාඨමාලා 3,000කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇති අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 45,033ක් නිකුත් කර ඇත. මේ අතර, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් මංගත ක්‍රමවේද සහ රූපවාහිනී පාඩම් මාලා හරහා පැවැත්වීමට ක්‍රියාමාර්ග ගත් අතර, සිසුන්ගේ පුහුණු කාර්ය සාධනය පිළිබඳ දත්ත රැස් කිරීමට මෙන්ම වැඩසටහන් අයදුම්කරුවන් ඇගයීම සඳහා මංගත පද්ධතියක් ද නිර්මාණය කළේය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් කිහිපයක් සඳහා නව ජාතික ප්‍රමිතීන් සකස් කළ අතර, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්වල අදාළත්වය අඛණ්ඩව සහතික කිරීම සඳහා පවතින මාර්ගෝපදේශ සංශෝධනය කළේය. මේ අතර, කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව විසින් පුහුණු ශ්‍රමිකයන් සඳහා පවතින කාර්මික ඉල්ලුමට සරිලන පරිදි දිවයින පුරා වෘත්තීය පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, තාක්ෂණ උද්‍යාන වැඩසටහන යටතේ වසර තුළ දී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් සිදු කරන ලද අතර, පුත්තලම ප්‍රදේශයේ නව කාර්මික විද්‍යාලයක් ආරම්භ කරන ලදී.

### නිවාස හා නාගරික සංවර්ධනය

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා ගණනාවක් මධ්‍යයේ වුව ද, රට තුළ නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය.** ඒ අනුව, සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා සුවපහසු සහ දැරිය හැකි මිල ගණන් සහිත නිවාස පහසුකම් සහතික කිරීමේ අරමුණ ඇතිව, සෞභාග්‍යයේ දැක්ම රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට සමගාමීව නිවාස ව්‍යාපෘති රැසක් ආරම්භ කරන ලදී. රජයේ දැක්මට අනුව, ඉඩමක් සතු වුවද, නිවාස ඉදිකර ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් *ඔබට ගෙයක් - රටට හෙටක්* වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සෑම ග්‍රාම නිලධාරී වසමකටම අවම වශයෙන් එක් නිවසක් ඉදිකර දීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2021 වසරේ දී නිවාස ඒකක 12,192ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, ඉන් නිවාස ඒකක 4,075ක ඉදිකිරීම් කටයුතු වසර තුළ දී නිම කරන ලදී. තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, පැවිදි භික්ෂූන් වහන්සේලාගේ අඩු ආදායම්ලාභී දෙමාපියන් සඳහා *මිහිඳු නිවහන* නිවාස වැඩසටහන සහ මැදි ආදායම් කාණ්ඩයේ පුද්ගලයන් සඳහා දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා *සියපත* සහ *සපිරි මහල්* නිවාස යන නිවාස වැඩසටහන් ද ක්‍රියාත්මක විය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ද නාගරික ප්‍රදේශවල සහ එම ප්‍රදේශවලට ආසන්න ප්‍රදේශවල වර්ධනය වෙමින් පවතින නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා මැදි ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ දැරිය හැකි මිලකට නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් රාජ්‍ය සේවකයන් ඇතුළු මැදි ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහාය විය.

**නාගරික සංවර්ධන අධිකාරිය විසින් පුරවැසි කේන්ද්‍රීය නගර සංවර්ධනයක් සිදු කරන අතරම, නාගරික පරිසර තුළ ජීවත්වීමේ හැකියාව වැඩිදියුණු**

**කිරීම ඉලක්ක කරමින් මෙම වසර තුළ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කළේය.** නාගරික සංවර්ධන අධිකාරියෙහි නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල, මිනුවන්ගොඩ පොළ, තත් කාලීනව ගංවතුර අවම කිරීමේ වැඩසටහන ඇතුළු ව්‍යාපෘති 57ක් පමණ වසර තුළ දී සිදු කරන ලදී. මෙම ව්‍යාපෘති යටතට රථගාල්, බස් නැවතුම්, පොදු වෙළෙඳපොළවල්, බහුකාර්ය ගොඩනැගිලි සහ නාගරික උද්‍යාන සංවර්ධනය ඇතුළත් වන අතර, නාගරික සංවර්ධනය සඳහා වන නගර සැලසුම්වලට අනුව සියලුම පළාත් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රාදේශීය නගර මධ්‍යස්ථාන වැඩි දියුණු කළ ජීවන පහසුකම් සහිත පුරවැසි කේන්ද්‍රීය නගර බවට ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් *සියක් නගර (නගර සියයක්) අලංකරණ වැඩසටහන* දියත් කරන ලදී. නාගරික පරිසරයේ සෞන්දර්යත්වය සහ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කරමින් රාජ්‍ය ආයතන සංවර්ධන ව්‍යාපෘති, බේරේ වැව ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය, යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සහ සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය වැනි තවත් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ද 2021 වසරේ දී ක්‍රියාත්මක විය. මීට අමතරව, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බස්නාහිර කලාපය තුළ සියලු පහසුකම්වලින් සමන්විත ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා නාගරික ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමට අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. ඒ අනුව, කඩවත සහ කොළඹ-කොටුව ප්‍රවාහන කේන්ද්‍රස්ථානය වැනි බහු මාදිලි ප්‍රවාහන මධ්‍යස්ථාන සහ නගරාන්තර දුම්රිය ගමනාගමන පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ දී තවදුරටත් සිදු කෙරිණි. විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරගත් ආයෝජන ව්‍යාපෘති වන ගාල්ල නගර මධ්‍යයේ සිදු වන ගාල්ල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, ග්‍රෙගරි වැව ආශ්‍රිත තේමා උද්‍යාන ව්‍යාපෘතිය, හම්බන්තොට සේවා සැපයුම් මධ්‍යස්ථානය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ බහු මහල් රථගාල ඇතුළු ව්‍යාපෘති කිහිපයක් දැනට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, නාගරික සංවර්ධන අධිකාරියෙහි සංවර්ධන වැඩසටහන් යටතේ එම ව්‍යාපෘති ඉදිකිරීම කඩිනම්ව සිදු කෙරෙමින් පවතී.

**ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව ජාතික ධාරිතාව ගොඩනැංවීම සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට රජය විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී.** නාගරික ප්‍රදේශ සඳහා දිගු කාලීන තිරසාර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැපයීම සඳහා කොළඹ අගනගරාශ්‍රිත කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2021 වසර අවසානය වන විට සියයට 87ක සමස්ත ප්‍රගතියක් අත්කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, 2022 වසරේ මැද භාගය වන විට එය අවසන් කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය අවසන් වූ පසු දැනට පවතින දුම්රිය මාර්ග භාවිත කරමින් දිනකට අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1,200ක් පමණ අරුවක්කාලු කසළ අංගනයට ප්‍රවාහනය කෙරෙනු ඇත. ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් පිළිබඳව ගැටලු පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් විසින් අවධානයට ලක් කර ඇති අතර, නිවැරදි සැලසුමක් සහ නිසි කළමනාකරණයක් සහිතව ක්‍රියාවට නැංවීම තුළින් මෙම සනීපාරක්ෂක කසළ අංගනය මගින් දිනෙන් දින වර්ධනය වන රටේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලුවට තිරසාර විසඳුමක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඉදිරි වසර කිහිපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණ උද්‍යාන පිහිටුවීමට සහ කුඩා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීමට රජය මුලික පියවර ගෙන ඇති අතරම, හෝමාගම, බදුල්ල හා යාපනය යන ප්‍රදේශවල යාන්ත්‍රික කොම්පෝස්ට් කර්මාන්තශාලා සංවර්ධනය කිරීමට පියවර ද ගෙන ඇත.

**දකුණු ආසියාවේ ප්‍රමුඛතම මූල්‍ය මධ්‍යස්ථානයක් සහ නවීනතම හා වඩාත් ආකර්ෂණීය නගරයක් ගොඩනැගීමේ අරමුණින් කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2021 වසරේ දී අඛණ්ඩව කරගෙන යන ලදී.** සියලුම ඉඩම් ගොඩකිරීම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, 2021 වසරේ මැයි මාසයේ දී සම්මත කරන ලද 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත මගින්, ගොඩකරන ලද ප්‍රදේශය විශේෂ ආර්ථික කලාපයක් ලෙස නම් කරන ලදී. යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම කාර්යාල සහ සිල්ලර වෙළඳසැල් හා නේවාසික ඒකක සංවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම්වලින් සමන්විත I වන අදියරෙහි යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ කටයුතුවලින් සියයට 67ක සමුච්චිත ප්‍රගතියක් සහ භූමි අලංකරණ කටයුතුවලින් සියයට 52ක ප්‍රගතියක් අත් කර ගනිමින්, වරාය නගර අභ්‍යන්තර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ ක්‍රියාකාරකම් 2021 වසරේ දී ක්‍රියාත්මක විය. තවද, 2021 වසර අවසානය වන විට කොළඹ අගනගරාශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට සමගාමීව, කොළඹ වරාය නගරයේ අපද්‍රව්‍ය හා අපජලය බැහැර කිරීමේ යටිතල පහසුකම්වලට අදාළ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පැවතුණි. මාලිගාකන්ද ජල සම්පාදන නල මාර්ගය ඉදිකිරීම අවසන් කරන ලද අතර, එළි හවුස් ජල සම්පාදන නල මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන්


3

2021 වසර අවසානය වන විට ප්‍රගතිය සියයට 55ක් විය. ගොඩබිමේ සිට කොළඹ වරාය නගරය සම්බන්ධ කරන ප්‍රධාන ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රධාන ප්‍රවේශ යටිතල පහසුකම් අතරින්, අධිවේගී මාර්ග ජාලයෙන් වරාය නගරයට ප්‍රවේශ වීමට ඉඩ සලසන, කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය 2021 වසර අවසානය වන විට සියයට 35ක ප්‍රගතියක් ලබා ඇති අතර, දකුණු කොළඹ සිට වරාය නගරයට ප්‍රවේශ වීමට හැකි මුහුදුබඩ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය එහි මූලික අදියරේ පවතී. සමුද්‍රීය යාත්‍රාංගණය, 2022 වසරේ ජනවාරි මාසයේදී, මහජනතාව සඳහා විවෘත කරන ලද අතර, යටිතල පහසුකම් සංවර්ධනය කඩිනමින් නිම කිරීමත් සමග ව්‍යාපෘතියේ I වන අදියර 2023 වසරේ මුල් භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

### සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

**දැනටමත් පවතින විෂමතා තවදුරටත් පුළුල් වීමත් සමග, දිළිඳුකම තුරන් කරලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රශංසනීය ප්‍රගතිය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වී ඇත.** බලයට පත් රජයන් විසින් දිළිඳුකම තුරන් කිරීම සඳහා ගනු ලැබූ බහුවිධ ප්‍රයත්නයන් සහ එම රජයන් විසින් සැමට ප්‍රතිලාභ අත්වන වර්ධනයක් ඇති කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශක දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ දරිද්‍රතාවය අවම කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. 2002 වසරේ *ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය* මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද

**3.16 රූප සටහන**
**දරිද්‍රතාවයෙහි ප්‍රවණතා**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නිල දරිද්‍රතා රේඛාවට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය 1995/1996 වසරවල දී පැවති සියයට 28.8ක සිට 2019 වසරේ සමීක්ෂණයේ දී සියයට 3.2ක් දක්වා අඩු වී ඇත. 2012/13 වසරවල ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත භාවිතයෙන් නිල දරිද්‍රතා රේඛාව මෑත කාලීනව යාවත්කාලීන කිරීමත් සමග, දරිද්‍රතාවය පහළ යෑම සම්බන්ධ ප්‍රවණතාව එකම ආකාරයක පෙන්නුම් කළද, 2019 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ජනගහනය සියයට 14.3ක් විය. ඒ අනුව, යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව, දරිද්‍රතා රේඛාවට පහළින් පුද්ගලයන් මිලියන 3.04ක් ජීවත් වන අතර, එය 2002 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බවට පූර්ව ඇස්තමේන්තු කළ පුද්ගලයින් සංඛ්‍යාවට වඩා 4.4 ගුණයකින් වැඩිවීමකි. 2019 වසරේ ගෘහ ඒකක අදායම් හා වියදම් සමීක්ෂණය අනුව, දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයන්ට අනුව දුප්පත් වන (Multidimensionally Poor) අතර, දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොට්ඨාශය, බර තැබූ එම බහුමාන දර්ශකවලට අනුව සාමාන්‍යයෙන් සියයට 42ක් පමණ විහිනතාවයක් අත්දකින බව අනාවරණය වේ. ඒ අනුව, ජාතික බහුමාන ජනගහන දරිද්‍රතා දර්ශක සාපේක්ෂ වශයෙන් ග්‍රාමීය අංශයේ සියයට 16.6ක් ලෙස ද වතු අංශයේ සියයට 51.3ක් ලෙස ද ඉහළ මට්ටමක පැවතුණි. වතු අංශයේ ජනතාව ඉහළ මට්ටමේ විහිනතාවයකට මුහුණ දී ඇත. දිස්ත්‍රික්ක අතර, බහුමාන දරිද්‍රතාවයේ අඩුම මට්ටම් කොළඹ (සියයට 3.5) සහ ගම්පහ (සියයට 5.1) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වූ අතර, ඉහළම දරිද්‍රතා අනුපාතය නුවරඑළිය (සියයට 44.2) දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු මට්ටමේ විෂමතාවක් පැවතිය ද, ජනගහනය අධික නාගරික ප්‍රදේශවල ජන ඝනත්වය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් බහුමාන වශයෙන් දිළිඳු පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි ඉහළ අගයක් ගත්තේය. කොවිඩ්-19 වසංගතයට පෙර සිටම ජනගහනයෙන් සැලකියයුතු කොටසක් දරිද්‍රතා අවදානමට මුහුණ දෙමින් සිටි බව මෙමගින් අවධාරණය කෙරේ. දිගු කාලයක් මුළුල්ලේ පවතින වසංගතය සහ ඉන් ඇති කෙරෙන බලපෑම් හේතුවෙන් ජනගහනය තුළ දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින කණ්ඩායම් තුළින් නව දුගී කාණ්ඩයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතී. රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම මෙන්ම අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් පැවතිය ද, දරිද්‍රතා මට්ටම් පැවතිය සහ විෂමතා අයහපත් අතට පත්වීමේ හැකියාව පිළිබඳව මනාව සැලකිල්ලට ගනිමින්, රජය සහ මහ බැංකුව විසින් පෙර නොවූ අන්දමේ රාජ්‍ය

මූල්‍ය සහ මුදල් උත්තේජක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා ජනගහනයේ අවදානමට ලක්විය හැකි අංශ කෙරෙහි වසංගතය මගින් ඇති කෙරෙන අහිතකර බලපෑම් අවම කිරීමට අඛණ්ඩව ඉලක්ක කරන ලදී. මෙම පියවර මගින් ජනගහනයේ මූල්‍ය හා පෝෂණ තත්ත්වය මත වසංගතය මගින් ඇති කරන බලපෑම යම් තරමකට අවම කරනු ඇති නමුත්, සෞඛ්‍ය සහ අධ්‍යාපන යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය සහ ගෘහ ඒකකවල වත්කම් පදනම වැනි වසංගතයට පෙර සිට පැවති අනෙකුත් විෂමතා ගෘහ ඒකකවල වර්තමාන සහ අනාගත නිෂ්පාදන ධාරිතාවට බොහෝදුරට බාධා පමුණුවා ඇත. ඉදිරියේදී, කොවිඩ්-19 හෝ එවැනි අනපේක්ෂිත සිදුවීම් මගින් ඇති කෙරෙන දිගුකාලීන බලපෑම් හරහා ගෘහ ඒකකවලට ඇති විය හැකි අහිතකර බලපෑම් වළක්වා ගැනීමෙහිලා රජය විසින් කාර්යක්ෂම සහ ඉලක්කගත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී, දරිද්‍රතාව සම්බන්ධ විස්තරාත්මක සහ මෑත කාලීන දත්ත, අදාළ ආයතන විසින් නිසි කලට ලබා දීම ඉතා වැදගත් වේ.

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජීවනෝපායන් අහිමි වීම මගින් මූල්‍යමය වශයෙන් ඇති වූ දුෂ්කරතා අවම කිරීමේ අරමුණ ඇතිව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් සමාජ ආරක්ෂණ පියවර කිහිපයක් රජය ආරම්භ කළේය.** කොවිඩ්-19 වසංගතය මගින් සමාජයේ අගහිඟකම් ඇති කණ්ඩායම්වලට ඇති කළ විෂමාකාර බලපෑම පිළිබඳව නිසි සැලකිල්ලක් යොමු කරමින්, රජය විසින් පවතින සමාජ සුබසාධන වැඩසටහන් අඛණ්ඩව දෙවන වසර සඳහාත් පුළුල් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, වසංගතයේ තුන්වන රැල්ල ඇතුළත රජය විසින් 2021 වසරේ අප්‍රේල් සහ ජූනි යන මාසවල අවස්ථා දෙකක දී අවදානමට ලක්විය හැකි පවුල් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන ලදී. එහිදී, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සුදුසුකම් ලත් පවුල් මිලියන 2.8ක් අතර රුපියල් බිලියන 14.1ක් පමණ බෙදා දුන් අතර, 2021 වසරේ ජූනි මාසයේ දී දෙවන වටය ලෙස, පවුල් මිලියන 1.7ක් අතර රුපියල් බිලියන 8.2ක් බෙදා දුන්නේය. සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභීන් හා අවදානමට ලක්විය හැකි පවුල්, වැඩිහිටි පිරිස් , ආබාධිත සහ වකුගඩු රෝගීන් ඇතුළු බොහෝ ගෘහ ඒකක මෙම වැඩසටහන තුළින් ප්‍රතිලාභ ලැබීය. මීට අමතරව, ජීවනෝපාය මාර්ග අහිමි වූ, එනමුත් රජයේ විසින් ලබාදෙන කිසිදු දීමනා වැඩසටහනකින් ආධාර නොලබන පවුල් ඉලක්ක කර ගනිමින් 2021 වසරේ අගෝස්තු මාසයේ දී එක් පවුලකට රුපියල් 2,000ක් බැගින් වූ දීමනාවක් ද ලබා දීමට රජය කටයුතු කළේය. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ රුපියල් බිලියන 11.8ක සමස්ත මුදල් ප්‍රමාණයක් බෙදා දී තිබුණි.

**3.17 රූප සටහන**
**දිස්ත්‍රික් මට්ටමේ බහුමාන දරිද්‍රතා දර්ශකය - 2019**




මූලය: ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය - 2019
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**පවතින සියලුම ආරක්ෂණ ජාල වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ එමගින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස්වල ආර්ථික යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා වසර තුළ දී රජය කැපවී කටයුතු කළේය.** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, දිගු කාලීන සමෘද්ධි සහන වැඩසටහන යටතේ රුපියල් බිලියන 51.6ක් ප්‍රතිලාභී පවුල් මිලියන 1.8ක් අතර වසර තුළ දී බෙදා දුන්නේය. ගෘහ ඒකකවලට ස්වෝත්සාහයෙන්ම දරිද්‍රතාවයෙන් මිදීමට හැකි වන පරිදි ආරක්ෂිත වළල්ලක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජීවනෝපාය, සමාජීය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් රාශියක් ද ක්‍රියාත්මක කරන ලදී. පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන සහ ජාතික පාසල් ආහාර වැඩසටහන යටතේ පාසල තුළ ආහාර වේල ලබා දීම වෙනුවට නිවසට රැගෙන යාම සඳහා සලාක ලබාදීම අඛණ්ඩව සිදු කළ අතර, තරුණ මව්වරුන් සඳහා රුපියල් 20,000/=ක පෝෂණ

3

### 3.14 සංඛ්‍යා සටහන
### ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

| වර්ෂය | දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන | | පෝෂණ දීමනා වැඩසටහන (අ) | | වියළි සලාක වැඩසටහන |
|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව (ආ) | වටිනාකම (රු. මිලියන) (ඇ) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආ) | වටිනාකම (රු. මිලියන) | වටිනාකම (රු. මිලියන) |
| 2017 | 1,388,242 | 39,707 | 372,407 | 5,408 | 84 |
| 2018 | 1,384,021 | 39,239 | 329,047 | 5,490 | 58 |
| 2019 | 1,800,182 | 44,660 | 300,246 | 5,279 | 105 |
| 2020 | 1,770,086 | 52,434 | 238,034 | 4,761 | ලැ.නො. |
| 2021 | 1,760,485 | 55,400 | 250,848 | 5,248 | ලැ.නො. |

(අ) ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා
(ආ) වසර අවසානයේ දී
(ඇ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
මුදල් අමාත්‍යාංශය

3

දීමනාව ද රජය අඛණ්ඩව ලබා දුන්නේය. මෙම වැඩසටහන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. අවශ්‍යතා සහිත පවුල් මුහුණ දෙන අභියෝග හමුවේ කුඩා දරුවන්ගේ සහ තරුණ මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ක්‍රියාමාර්ග ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 මගින් දිළිඳු පවුල් මත ඇති කෙරෙන විෂමාකාර සහ ක්ෂණික බලපෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසර සඳහා වන අයවැයෙන් යෝජිත පරිදි 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට ප්‍රතිලාභී පවුලකට ලබා දෙන සමෘද්ධි සහනාධාර මුදල සියයට 28කින් පමණ වැඩි කිරීමට ගත් තීරණය මගින් සමෘද්ධි වැඩසටහන තවදුරටත් පුළුල් කෙරිණි. ඒ අනුව, පවුලකට රුපියල් 3,500ක්, රුපියල් 2,500ක් සහ රුපියල් 1, 500ක් බැගින් වූ පවුල් ඒකක දීමනා, පිළිවෙළින්, එක් පවුලකට රුපියල් 4,500ක්, රුපියල් 3,200ක් සහ රුපියල් 1,900ක් දක්වා ඉහළ නංවන ලදී.

**දරිද්‍රතාවය තුරන් කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ශ්‍රී ලංකාවට අත්කර ගැනීමට උපකාරී වී ඇති පවතින ආරක්ෂණ ජාල මගින්, කොවිඩ්-19 වසංගතය හරහා සමාජයේ අවදානමට ලක්විය හැකි කොටස් කෙරෙහි ඇති කෙරෙන බලපෑම අවම කර ගැනීමට ද උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඵලදායී හා තිරසාර ප්‍රතිඵල සහතික කිරීම සඳහා එවැනි ආරක්ෂණ ජාල කාර්යක්ෂම ලෙස ඉලක්කගත කිරීම සහ රජයේ අයවැය මත පදනම් නොවන නව ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය වේ.** මෑත වසරවල දී, දුර්වල ඉලක්කකරණය හේතුවෙන් සමෘද්ධි වැනි සහනාධාර වැඩසටහන් දරිද්‍රතාවය පිටුදැකීමෙහිලා අඩු ඵලදායීතාවයක් පෙන්නුම් කිරීම පිළිබඳව දැඩි අවධානයක් යොමුව ඇත. සැබවින්ම අවදානමට ලක්විය හැකි පුද්ගලයින් හඳුනා ගැනීමට සහනාධාරලාභීන්ගේ ලැයිස්තුව නැවත සමාලෝචනය කිරීම, දුගී ජනතාව සඳහා ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සාධාරණ කාල සීමාවක් තුළ සමාජ සුබසාධන වැඩසටහන්වලින් ඵලදායී ලෙස ප්‍රතිලාභීන් ඉවත් කිරීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම යනාදිය මගින් මෙවැනි ආරක්ෂක වැඩසටහන් ආශ්‍රිතව රජයේ අයවැය මත වන පීඩනය අවම කෙරේ. මේ අතර, සමාජ ආරක්ෂක වැඩසටහන් ඉලක්කගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම ඉතා වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගත්කල, එවැනි මැදිහත්වීම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නිරන්තරයෙන් යාවත්කාලීන කෙරෙන සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් ස්ථාපිත කිරීම කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, ශ්‍රී ලංකාවේ ජනගහනය ශීඝ්‍රයෙන් වයස්ගත වීම මගින්, විශේෂයෙන්ම රජයේ විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක යෝජනා ක්‍රම වැනි පවතින සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් ආවරණය නොවන අවිධිමත් අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රම හඳුන්වාදීමේ වැදගත්කම අවධාරණය කරයි. වර්තමානයේ ජනගහනයෙන් සියයට 30ක් පමණක් විධිමත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් මගින් ආවරණය වන නමුත්, අඩු වෙමින් පවතින රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ රජයේ වත්මන් විශ්‍රාම වැටුප් රාමුව රජයේ අයවැය මත දිනෙන් දින වර්ධනය වන මූල්‍ය පීඩනයක් බවට පත්වෙමින් තිබේ. එමනිසා, විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන්ගේ ආයු අපේක්ෂාව ඉහළ යෑම සහ ඔවුන්ගේ වැඩිවන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ඉදිරි දශක කිහිපය තුළ සෑමට සුරක්ෂිත විශ්‍රාම ක්‍රමයක්

සහතික කිරීම සඳහා දීපව්‍යාප්ත දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම තුළින් රටේ සමාජ ආරක්ෂණ රාමුව පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

## පරිසරය

**පරිසර අමාත්‍යාංශය රටේ ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාළ නියාමන සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමට අදාළ මූලික පියවර කිහිපයක් ක්‍රියාත්මක කළේය.** පාරිසරික ගැටලු අවම කිරීම සහ තිරසාර සංවර්ධනයට සහාය වීම සඳහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන පියවර ලෙස *ජාතික පාරිසරික ප්‍රතිපත්තිය - 2022 සහ ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2021 - 2030* සකස් කිරීම සිදුවිය. පාරිසරික සංවේදී ප්‍රදේශ වන ජෛව විවිධත්වයට අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීමේ අරමුණින් සකස් කළ, *ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය*, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. 2012 වසරේ දී සකස් කරන ලද *ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය*, දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් මෑත කාලීන ප්‍රවණතා ද ඇතුළත් කරමින් වර්තමානයේ දී යාවත්කාලීන කෙරෙමින් පවතී. 2021 වසර තුළදී, විවිධ පාර්ශ්වකරුවන්ගේ සහය සහිතව ගංගා පද්ධතියේ දූෂණය අවම කිරීම ඉලක්ක කරගත් *සුරකිමු ගංගා* වැඩසටහන සහ *හුස්ම දෙන තුරු දීප ව්‍යාප්ත ජාතික රුක් රෝපණ වැඩසටහන* වැනි තවත් පාරිසරික වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක විය. 2021 වසරේ මාර්තු 31 වන දින සිට තනි භාවිත ප්ලාස්ටික් නිෂ්පාදන තහනම් කිරීමේ නීති ගැසට් කිරීම හා බලාත්මක කිරීම මෙන්ම ප්ලාස්ටික් කාණ්ඩ කේතකරණ පද්ධතියක් හඳුන්වාදීම වසර තුළ දී ගනු ලැබූ ප්‍රධානතම ප්‍රශංසනීය ක්‍රියාමාර්ග වේ. මෙ.වො. 10ක විදුලි බලයක් ජනනය කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකාවේ පළමු අපද්‍රව්‍ය බලශක්ති බලාගාරය කෙරවලපිටියේ ඉදි කිරීම ද වසර තුළ දී තබන ලද ප්‍රධාන පියවරක් විය. දිරාපත් වන අපද්‍රව්‍ය යොදා ගනිමින් ජීව වායුව මගින් විදුලිය නිපදවීම සඳහා කොටවිල ප්‍රදේශයේ තවත් බලාගාරයක් ඉදිකිරීමේ කටයුතු ද මේ වනවිට ක්‍රියාත්මක වේ. මෙමගින් ජාතික විදුලිබල පද්ධතියට කි.වො. 400ක් එකතු කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව තුළ ඉහළ යන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු තිරසාර ලෙස විසඳීමට මෙවැනි ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එක්ව පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීමට සහ රටේ ඇති වන ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම් කිරීම හා එම ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම වැඩිදියුණු කිරීමට අදාළ පියවර ක්‍රියාත්මක කිරීමෙහි අඛණ්ඩව නිරත විය.** වසර තුළ දී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සාමාන්‍ය ජනතාවට, අදාළ ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර ප්‍රජාවට ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම් වීමට පහසුකම් සැලසීමට සහ ස්වභාවික විපත්වලින් ඇතිවන අවදානම් අවම කර ගැනීමට විශේෂ කාලගුණ අනතුරු ඇඟවීම් 338ක් නිකුත් කර ඇත. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ තෙල් කාන්දුව, නිරිතදිග මෝසම් ගංවතුර ආපදා සහ දෙවන අන්තර් මෝසම් කාලසීමාව අතරතුර ඇති වන ගංවතුර තත්ත්වයන් සම්බන්ධ ප්‍රතිපත්තිමය රාමුව ක්‍රියාත්මක කිරීමට අමතරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ තෙල් කාන්දුව තක්සේරු කිරීම සඳහා කටයුතු කළේය. තෝරාගත් නගර සඳහා බහුවිධ ආපදා විශ්ලේෂණයක් සකස් කිරීම සහ දීප ව්‍යාප්තව පාසල් මුහුණ දෙන ආපදා අවදානම තක්සේරු කිරීමට අදාළ කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 2021 වසරේ දී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විශේෂයෙන් ම, රත්නපුර, කෑගල්ල, කළුතර, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි නාය යෑම් සහ බෑවුම් කඩා වැටීම්වලට අදාළව, අධීක්ෂණ කටයුතු, වාසස්ථානවලින් ඉවත් වීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා සඳහා පිළියම් යෙදීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල සක්‍රීයව නිරත විය. වසර තුළ දී, අවශ්‍ය පරීක්ෂණ සහ විශ්ලේෂණ සිදු කිරීමෙන් පසු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා 6,763ක් නිකුත් කරන ලදී. තවද, ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ස්ථාන 24ක නායයෑම් අවම කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, තවත් ස්ථාන 32ක ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පැවතුණි. නාය යෑම් අවදානමට ලක්විය හැකි ස්ථාන 147කට අදාළ සියලුම අවදානම් අවම කිරීමේ කටයුතු 2025 වසර වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

3